ලියෝ තෝල්ස්තෝයි

කුහුඹියා සහ පරවියා



කඩුල්ල ප්‍රකාශන

කඩුල්ල ප්‍රකාශන

KADULLA PUBLICATION

ලියෝ තෝල්ස්තෝයි

ළමා කතන්දර

(කුහුඹියා සහ පරෙවියා)

Lev Tolstoy

THE ANT AND THE PIGEON

කෘතියේ සිංහල පරිවර්තනය

පරිවර්තනය - උපුල් ප්‍රියශාන්ත මාතරආරච්චි

කඩුල්ල ප්‍රකාශන
KADULLA PUBLICATION

ලියෝ තෝල්ස්තෝයි - ළමා කතාන්දර

Lev Tolstoy - THE ANT AND THE PIGEON

කෘතියේ සිංහල පරිවර්තනය

පරිවර්තනය - උපුල් ප්‍රියශාන්ත මාතරආරච්චි

ISBN - 978 - 955 - 8499 - 87 - 0

පරිගණක මෙහෙවර
සහ කවර ප්‍රති නිර්මාණය - චම්පික ප්‍රසාද්

CREATIONS
No: 522, Wewa Junction, Kandana
Tel : 011 5 725 547, Mob : 071 8 416 436
E-mail : isiracreations@gmail.com

මුද්‍රණය හා
ප්‍රකාශනය -

කඩුල්ල ප්‍රකාශන
240/3, පහළ බියන්විල, කඩවත.
දුර : 071 8 179 230 / 071 3 633 311
ෆැක්ස් : 071 9 376 914
email : kadullabooks@gmail.com

පටුන

අශ්වයා සහ වෙළඹ 9
නරියා සහ කොකා 10
වානර අම්මගේ දරුවෝ 12
වෘකයා සහ ලේනා 14
රාජාලියා සහ කපුටා 16
කුකුලෝ දෙදෙනා සහ රාජාලියා 17
සංග්‍රාම 18
මී පැටියා, කුකුළා සහ බලලා. 20
අළුත් නීතිය සහ නරියාගේ සාමය. 22
වෘකයා සහ බල්ලා 24
උත්සහවන්තයා සහ දෙවියන් වහන්සේ 26
කෑදර මීයා 28
නොගැලපෙන ආගන්තුකයා 29
අසමඟිය සහ ගෙදර 30
නගරයේ මීයා සහ ගමේ මීයා 31
කපටියා සහ ඔට්ටුව 32
අම්මා සහ ගින්දර 34
හොඳම ක්‍රමය සහ එකම උපාය 36
නායකයා සහ නායකත්වය 38
කියද්දී මෙහෙමයි කරන්නේ මෙහෙමයි. 40
විනාශයේ හඬ 42
වේලාවේ වරද 43
මැක්කන් පළවා හැරීම 44
වාසනාව සහ අවාසනාව 45
පුංචි දෙයින් ලොකු පාඩමක් 46
ආගන්තුක සත්කාරය 47
උත්සාහය සහ ජයග්‍රහණය 48
පුංචි වැරුද්ද සහ ලොකු දඬුවම 49

(II)

පුංචි බොරුව සහ ලොකු අලාභය 51
කළගුණ සැලකීම 52
වෙස් වළා ගැනීම 53
බැරි වැඩ නොකරන් 54
උරුමය සහ කරුමය 56
බලවතා සහ දුබලයා 58

මසුරුකමේ විපාකය. 60
මිනිසා සහ රන් බිජුව. 61
ප්‍රශංසාව හා උගුල. 62
ආශාව සහ විනාශය. 64
අතරමැදියා. 65
මිනිසුන්ගේ හැටි. 66
කෑම සහ විනෝදය. 68
ගෙම්බා සහ සිංහයා 69

(III)

උපකාරය. 71
වැඩ සහ අවැඩ. 72
තණ්හාව සහ ආශාව. 73
පුරුද්ද සහ බුද්ධිය 74
තිත්ත මිදි 76
වෙන වැඩ සහ නොවෙන වැඩ. 78
රැවටීම සහ වැනසීම 79
නිධානය තිබෙන තැන. 80
පිපාසයේ ගැඹුර. 81
කොකා සහ මාන කොකා. 82
අද සහ හෙට. 84
හවා සහ ගෙම්බා. 86

(IV)

වලිගය නැති නරියා. 87
මදුරුවා සහ සිංහයා. 88
ප්‍රමාදය පසු තැවිල්ලට හේතු වේ. 90
සිහිඳු බවේ රහස. 92
අශ්වයා සහ උගේ හාම්පුතා. 93
වෘකයා සහ එළුවා. 94
ගෝනා සහ අං තට්ටුව. 96
ගෝනා සහ මිදිවත්ත. 98
මහල්ලා සහ මරණය. 99
සිංහයා සහ නරියා. 100
බළල් උපාය සහ මී නුවණ. 101

(V)

මොළයක් නැති 'මහ රජා'. 103
වළහා කීව රහස. 104
අවංකකමේ තෑග්ග. 106
බඩගිනි වෘකයා සහ අහිංසක බැටළු පැටියා. 108
හොඳම බෙහෙත සහ නරක උපදේශය. 110
බදාගැනීම සහ බෙදාගැනීම. 111

කවුද බලවත්? 113

(VI)

බැටළු ආදරය 115
වැඩි ප්‍රවේශමත් හොඳ නැහැ 116
ඔට්ටු තියලා අපි දුවමුද? 117
වටුවා සහ ගොවියා. 118
කුරුළු රජකම. 120
වලසා සහ මී මැස්සෝ 122
කදිම විනිශ්චය. 123
කවුද වැදගත්. 124
වටුවා සහ දඩයක්කාරයා 125
ගේ කුරුල්ලා 126
රාජාලියා සහ පරෙවියෝ. 127
මිනිස්සු සහ නොමිනිස්සු. 128
දෙකම එකයි. 130
වවුලා සහ පිල් මාරුව. 131
මසුරාගේ වස්තුව. 132
දුදනන්ට කළ උපකාරය. 134
තෑග්ගක් වූ දඬුවම. 135
එඬේරාගේ පොරොන්දුව සහ දෙවියන් වහන්සේ. 136
බල්ලා පිදුරු කන්නෙත් නෑ කන ගොනාට දෙන්නෙත් නෑ. 138
වෘකයා සහ මස් කටුව. 139
බල්ලා සහ හොරා. 140
අශ්වයාගේ කොරය හා වෘකයාගේ බෙහෙත්. 142
නරියා සහ වෘකයා 144
ගෝනා සහ අශ්වයා 145
ඔහූ ඔළුව පසාවධී 146
නවාතැන් දීම. 147
ගවයා සහ මැඩියා 148
රජෙක් ඉල්ලූ මැඩියෝ 149
අපූරු දිවිරුම. 150
සුසියා සහ සුළඟ 151



I

අශ්වයා සහ වෙළඹ

එක්තරා ගොවියෙකුට අශ්වයෙක් සහ වෙළඹක් සිටියා. වෙළඹ දවස පුරාම තණකොළ පිරුණු මිටියාවතට වී සිත් සේ තණ කමින් සිටිනවා විනා කුඹුර 9
හාන්නට නොයයි. එහෙත් අශ්වයා රාත්‍රී කාලයේ පමණක් තණකොළ කා දහවල් කාලයේ කුඹුර හාන්නට යයි. දිනක් වෙළඹ අශ්වයාට මෙසේ පැවසුවා,

" ඇයි ඔයා කුඹුර හාන්නේ ? මම නුඹ වුනානම් මම යන්නේ නැහැ. හාම්පුතා මට කසපහර දුන්නොත් මම ඔහුට පයින් පහරක් දෙනවා". පසුදින අශ්වයා වෙළඹ කියූ ලෙසටම ක්‍රියා කළේ ය. ගොවියා සිතුවේ අශ්වයා මුරණ්ඩු වී ඇති බවයි. ඉන්පසු ඔහු අශ්වයාගේ සෑදලය වෙළඹට අන්දවා අශ්වයා වෙනුවට වෙළඹ කුඹුර හාන්නට ගෙන ගියේ ය.

10

නරියා සහ කොකා

එක්තරා වෙළක් ළඟ නරියෙකුයි කොකෙකුයි ඉතා කුලුපගුව ජීවත් වුණා. දිනක් නරියා කොකාට රෑ කෑමකට ආරාධනා කළේය. කොකා පැමිණි පසු නරියා පැතලි පිඟානකට ආහාර දමා පිළිගැන්වීය. උගේ දිග හොටය නිසා ආහාර කිසිවක් ගැනීමට නොහැකි විය. කොකා බලා සිටියදී නරියා සියලුම ආහාර තනිවම ගිල දැම්මේය. කොකා බඩගින්නේම ගෙදර ගියා.

පසු දින කොකා නරියාට රෑ කෑමකට ආරාධනා කර දිගු හොටක් සහිත පෝග්ගුවකට ආහාර දමා නරියාට පිළිගැන්වීය. නරියාට තම හොම්බ එතුලට දමා ගත නොහැකි වූ බැවින් නිරාහාරව බලා ඉන්නට සිදුවිය. එහෙත් කොකා තම දිගු හොටය පෝග්ගුව තුලට දමා සියලුම ආහාර තනිවම ගිල දැම්මේය. නරිහාමි බඩගින්නේම යන්න ගියා.

වානර අම්මගේ දරුවෝ

එක්තරා වැඳිරියකට කුඩා පැටවුන් දෙදෙනෙක් සිටියා. එහෙත් වැඳිරිය ආදරය කළේ එක් පැටවෙකුට පමණයි. අනෙක් පැටවාට ආදරය නොකළා ය. දිනක් මිනිසුන් පිරිසක් වැඳිරිය දැක අල්ලා ගැනීමට සිතා පසුපස එළවාගෙන ගියා. වැඳිරිය ඇය වැඩියෙන්ම ආදරය කළ පැටවා පමණක් රැගෙන මිනිසුන් ගෙන් බේරීමට දිව ගියා ය. තනිවූ අසරණ වඳුරු පැටවා අසල තිබූ වන ලැහැබක් තුළ සැඟවුණා. මිනිසුන් ඌ දුටුවේ නෑ. ඔවුන් වඳුරු පැටවා පසුකරමින් වැඳිරිය පසුපස ගියා.

මහත්සේ කලබල වී සිටි වැඳිරිය අත්තෙන් අත්තට පනිමින් ආරක්‍ෂාව පතා පළා යන අතර ඇගේ අතේ සිටි පැටවාගේ හිස අත්තක වැදී හිස පැලී මිය ගියාය. කැළයේ සැඟවී සිටි වැඳිරිය මිනිසුන් ආපසු ගියපසු අනෙක් පැටවා සොයා ගියා. එහෙත් එතන කුඩා වඳුරු පැටියා නොසිටි නිසා වැඳිරියට පැටවුන් දෙදෙනාම අහිමි වී වඳුර අම්මාට තනිවන්නට සිදු වුණා.

වෘකයා සහ ලේනා

දඬුලේනෙක් ගස් අතුමත එහා මෙහා පනිමින් සිටියදී නිදාසිටි වෘකයෙකුගේ ඇඟ මතට වැටුණා. අවදි වූ වෘකයා දඬුලේනාව අල්ලාගෙන කන්නට සූදානම් වුණා.

"අනේ මට යන්න දෙන්න" දඬුලේනා බැගෑපත් වුණා.

"හොඳයි" වෘකයා කීවා. "මම නුඹට යන්න දෙන්නම්. හැබැයි නුඹ මට කියන්න ඕනේ ඇයි නුඹලා වගේ දඬුලේන්නු මේ තරම් සතුටින් ඉන්නේ කියලා." මම නම් හැම තිස්සෙම දුකින් ඉන්නේ නමුත් නුඹලා හැම තිස්සෙම සෙල්ලම් කරමින් පිණුම් ගසමින් ඉන්නේ කොහොමද?

දඬුලේනා වෘකයාට මෙසේ පිළිතුරු දුන්නා.

"මුලින්ම මට යන්නට දෙන්න. මම උඩට ගිහිල්ලා ඒ ගැන කියන්නම්. මම නුඹට බයයි."

වෘකයා දඬුලේනාට යන්නට ඉඩ හැරියා. හනිකට ගහ උඩට නැගගත් දඬුලේනා මෙසේ පැවසුවා.

"උඹ දුකින් ඉන්නෙ නුඹ නරක නිසයි. නුඹේ නරක ගති පැවතුම් නුඹේ හිත දුකට පත් කරනවා. අපි සතුටින් ඉන්නේ අපි හොඳ නිසයි. අපි වෙනත් කෙනෙකුගේ ප්‍රාණයට පීඩාවක් නොකරන නිසයි."



රාජාලියා සහ කපුටා

බැටළුවෝ රංචුවක් පිට්ටනියක තණකොළ කමින් සිටියා. හදිසියේම රාජාලියෙක් පැමිණ උගේ තියුණු නියවලින් එක බැටළු පැටවෙකු ඩැහැගෙන ඉගිල ගියා. මෙය දුටු කපුටෙකුටත් බැටළු මස් රස බැලීමේ ආශාවක් ඇතිවුණා.

"මෙය ඉතා ලෙහෙසි ක්‍රියාවක්, වඩා හොඳට මම මෙය කරන්නම්. රාජාලියා මෝඩයෙක්, ඔහු ඩැහැගත්තේ බැටළු පැටවෙක්ව. එහෙත් මම හොඳ බැටළු නාම්බෙක්ව ඩැහැගන්නවා." කපුටා තමාටම කියා ගත්තා.

මෙසේ සිතූ කපුටා පියඹා විත් උගේ නියපොතු තරුණ බැටළුවෙකුගේ ලොම්වල පැටළුවා. කපුටාට උවමනා වුණේ බැටළු නාම්බාවත් ඔසවාගෙන පියඹා යන්නයි. එහෙත් උගේ නියපොතු බැටළු ලොම්වල පැටළුනා පමණයි. කොතරම් තදින් ඇද්දත් නියපොතු ඉහළට ආවේ නෑ. මේ වෙලාවේ එඬේරා පැමිණියා. බැටළු ලොම්වල පැටලී දඟලන කපුටාගේ කකුල් වලින් අල්ලා එළියට ඇද ඌව මරා දැමුවා.

කුකුලෝ දෙදෙනා සහ රාජාලියා

කුකුල්ලු දෙදෙනෙක් කසළ ගොඩක් අසළ රණ්ඩු කරමින් සිටියා. එක් කුකුළෙක් අනිකාට වඩා ශක්තිමත් ශක්තිවන්තයා අනෙකාට පහර දී පරාජය කොට කසළගොඩ අසලින් පන්නා දැමුවා. කිකිළියෝ පැමිණ ශක්තිවන්ත කුකුළා වටකොටගෙන උගේ ශක්තිය ගැන ප්‍රශංසා කළා. මෙම කුකුළාට තම ශක්තිය අනෙකුත් අසල්වැසි කුකුළන්ටත් කියන්නට ඕනෑ උනා. ඌ පියාඹා ගොස් වහළය මත වසා පියාපත් විදහාගෙන මෙසේ පැවසුවා.

" හැමෝම මා දිහා බලන්න. මම කුකුලෙක්ව පරාජය කළා.මේ ලෝකයේ වෙන කිසිම කුකුළෙක් මා තරම් ශක්තිමත් නෑ''. යි සතුටින් උදම් ඇනුවා. මේ මොහොතේ පියඹා ආ රාජාලියෙක් පුරසාරම් දොඩවමින් සිටි කුකුළා මතට පහත් වී තම නියවලින් කුකුළාව ඩැහැගෙන උගේ කූඩුවට රැගෙන ගියා.

සංග්‍රාම

උදෑසනක මහලු මිනිසෙක් සහ තරුණයෙක් පාරේ ඇවිද යමින් සිටියදී වැටී තිබූ සල්ලි මල්ලක් දුටුවා. තරුණයා වහාම සල්ලි මල්ල අහුලා ගත්තා.

"දෙවියන් විසින් මට මෙය ලබා දුන්නා"තරුණයා පැවසුවා."අපි එය බෙදා ගනිමු." මහල්ලා තරුණයාට යෝජනා කළා.

"නෑ එය සොයාගත්තේ මමයි. එම නිසා එය අයිති මටයි. තරුණයා මහල්ලාගේ යෝජනාව ප්‍රතික්ෂේප කරමින් පැවසුවා. මහල්ලා ඉන්පසු කිසිවක් කීවේ නෑ. ඔවුන් නිහඬව

ටික දුරක් ඉදිරියට ගමන් කළා. හදිසියේ ඔවුන්ට ඇසුණා අසරුවන් කණ්ඩායමක් ඔවුන් ලුහුබැඳ එනබව. වේගයෙන් පැමිණි අසරුවන් කණ්ඩායම ඔවුන්ගෙන් ප්‍රශ්ණ කලා.

" කවුද අපේ සල්ලි මල්ල හොරකම් කලේ ?"

එය ඇසූ තරුණයා බියට පත්වුණා.

" මාමේ අපි ප්‍රාර්ථනා කරමු අපි සොයාගත් මේ සල්ලි මල්ල නිසා අපට කරදරයක් නොවේවා කියා" තරුණයා පැවසුවා.

" එය සොයා ගත්තේ ඔබයි. මම නොවෙයි. ඉතින් කරදර විඳිය යුත්තේ ඔබයි. මම නොවෙයි. " මහල්ලා පිළිතුරු දුන්නා. අසරුවන් කණ්ඩායම තරුණයාව අල්ලාගෙන නගරයට රැගෙන ගියා. මහල්ලා ඔහුගේ ගෙදර ගියා.

මී පැටියා, කුකුළා සහ බළලා.

පුංචි මී පැටියෙක් තනිවම ඇවිදින්නට ගියා. මී පැටියා අවට පරිසරයේ ඇවිදලා ටික වෙලාවකට පසුව මී අම්මා ලඟට ගොස් මෙසේ පැවසුවා.

" අම්මේ මම සත්තු දෙදෙනෙක්ව දුටුවා. එකෙක් ඉතා විරූපියි. අනෙකා ඉතා ලස්සනයි."

" මට කියන්න ඔවුන්ගේ හැඩරුව " අම්මා පැවසුවා.

" විරූපී සතා මිදුලේ ඒ මේ අත ඇවිදිමින් සිටියා. ඌට තිබුණේ කලු කකුල්, රතු කොණ්ඩයක් ලොකු ඇස් දෙකක් සහ කෙක්කක් වැනි නහයක්. මම ඌ ළඟින් යද්දී ඌ හොටය ඇරලා කකුලක් උස්සලා මහා හයියෙන් කෑ ගැසුවා. මම බයවෙලා එතැනින් පැන දිව්වා.

" පුතේ ඒ තමයි කුකුළා. ඌ කාටවත් කරදරයක් හිංසාවක් කරන්නේ නැහැ. ඌට බයවෙන්න එපා. දැකපු අනිත් සතා මොන වගේද ?

" ඔහු ලස්සනයි. අව්ව තපිමින් සිටියා ඌට තිබුණේ සුදු බෙල්ලක් සහ අළුපාට සිනිඳු කකුල්. ඌ උගේ සුදුපාට පපුව ලෙවකාලා වළිගය වනලා මා දිහා බැලුවා. පුංචි මීයා තමන් දැකපු දේ විස්තර කලා.

" නුඹ නම් හරිම මෝඩ මී පැටියෙක් "

අම්මා කීවා.

" ඒ තමයි පූසා "

අළුත් නීතිය සහ නරියාගේ සාමය.

හබන් කුකුළෙක් ගසක් මත වාඩිවී සිටියා. නරියෙක් පැමිණ හබන් කුකුළාට මෙසේ පැවසුවා.

" සුභ දවසක් යාළුවේ. මට ඔබගේ ඉමිහිරි කටහඬ ඇසුණා. මා පැමිණියේ ඔබත් සමඟ කථා කරන්නයි." " ඔබගේ කරුණාවන්ත කමට ස්තූතියි." හබන් කුකුළා පැවසුවා.

නරියා එය ඇසුණේ නැති බවක් පෙන්වමින්

" මොකක්ද කිව්වේ, මට හරියට ඇසුණේ නෑ. ඇයි ඔබ පහළට පැමිණ මා සමඟ කථා කරන්නේ නැත්තේ ? ඔබ ඉහළ සිට කියන දේ මට ඇහෙන්නේ නෑ "යි කීවා.

" මට පහළට එන්නට බයයි " හබන් කුකුළා පිළිතුරු දුන්නා. " අපි වැනි කුරුල්ලන් පහළට පැමිණීම ටිකක් අවදානම් වැඩක් "

ඔබට නොවේ තවත් අනතුරුදායක සතුන් ඉන්නවෙන්." හබන් කුකුළා පැවසුවා.

" නෑ යාළුවේ දැන් අළුත් නීතියක් ප්‍රකාශයට පත් කරලා තිබෙනවා. හැම කෙනෙකුම සාමයෙන් සිටිය යුතුයි කියලයි එයින් කියවෙන්නේ. ඒ නිසා දැන් කිසි කෙනෙක් තව කෙනෙකුට හිංසාවක් කරන්නේ නෑ." නරියා පිළිතුරු දුන්නා.

" ඒක හොඳයි මොකද දැන් බල්ලන් එන්නට පුළුවන්. මේ අළුත් නීතිය තිබුණේ නැතිනම් ඔබට ඔවුන්ගෙන් බේරීමට ඈතට දුවන්නට සිදුවෙනවා. නමුත් දැන් බියවීමට හේතුවක් නෑ." හබන් කුකුළා නරියාට කීවා.

බල්ලන් ගැන ඇසූ පමණින් නරියා කලබලයට පත්වුණා. ඌ කන් ඔසවා වල්ගය කරකවමින් බල්ලන් පැමිණේදැයි විපරම්කර බලා එතනින් යන්නට සැරසුණා. 23

"ඔබ කොහේද යන්නේ? දැන් නීතියක් තියෙනවනේ. ඔබ බියවිය යුතු නැහැ. බල්ලන් ඔබට කරදර කරන්නේ නෑ."

" කවුද දන්නේ ? සමහරවිට බල්ලන් මේ නීතිය ගැන තවම දන්නේ නැතුව ඇති "යි පවසමින් නරියා දුවන්නට වුණා.

වෘකයා සහ බල්ලා

දිනක් වැහැරුණු බඩගිනි වෘකයෙක් ගමක් අසලින්
 ඇවිද යමින් සිටියදී ලොම් පිරුණු පුෂ්ටිමත් බල්ලෙක්ව මුණ ගැසුණා.

" බලු රාලේ " වෘකයා බල්ලාට කථාකලා. " ඔබලාට කොහෙන්ද ඔය තරම් ආහාර ලැබෙන්නනේ ?"

"මිනිසුන් අපට ඒවා ලබා දෙනවා" බල්ලා පිළිතුරු දුන්නා.

" ඔබ ඔවුන්ට මහන්සි වී වැඩ කර දෙනවාද ? "

" නෑ අපි මහන්සි වෙන්නේ නෑ " බල්ලා කීවා. " අපේ රාජකාරිය තමයි රෑ පුරාම ගේ ආරක්ෂා කරන එක."

" ඔවුන් ඔබට කන්නට දෙනවාද මේ සුළු වැඩේ වෙනුවෙන්. මමත් කැමතියි ඔබට උදව් කරන්නට. අපි වැනි වෘකයින්ට දැන් කෑම සොයා ගැනීමත් දැන් අපහසුයි" වෘකයා දුක්මුසුව පැවසුවා.

" එන්න මා සමඟ , මගේ ස්වාමියා ඔබටත් කෑම ලබා දේවි." වෘකයා බල්ලාත් සමඟ ගමට යන්නට පිටත් වුණා. යන අතරතුරදී බල්ලාගේ බෙල්ලේ පමණක් ලෝම හැලී තිබෙනු දුටු වෘකයා, 25

" යහළුවේ , ඔබේ බෙල්ලේ පමණක් ලෝම නැත්තේ මොකද? " වෘකයා ඇසුවා.

" නෑ මේ නිකම් " බල්ලා පැවසුවා.

" ඒ කිව්වේ "

එය මගේ දම්වැලෙන් ඇතිවූ ලකුණක්. දහවල් කාලයේ දී මට දම්වැලක් දමා බැඳ තබනවා. ඒ නිසා තමයි මෙසේ සිදු වී තිබෙන්නේ "

" එහෙනම් යාළුවේ මම ආපහු යන්නම්. මම නම් යන්නේ නෑ මිනිසුන් සමඟ ජීවත් විමට. කොතරම් බඩගින්නේ සිටියත් මම මගේ නිදහස නැතිකර ගන්නේ නැහැ. " යි කියමින් වෘකයා ආපහු කැළයට ගියා.

උත්සහවන්තයා සහ දෙවියන් වහන්සේ

ධීවර පිරිසක් මුහුදේ මාළු බාමින් සිටියදී හදිසියේ කුණාටුවක් ඇතිවුණා. ධීවරයන් බියට පත්වී හබල් අතහැර උදව් ඉල්ලා දෙවියන්ට කන්නලව් කළා. එහෙත් ඔවුන්ගේ බෝට්ටුව වෙරළෙන් ඈතට දියඹට ඇදී ගියා. වැඩිමහල් ධීවරයා අනෙක් අයට මෙසේ කීවා.

"ඇයි කොල්ලනේ හබල් අත හැරියේ ? දෙවියන්වහන්සේ උදව් කරන්නේ උත්සහවන්තයන්ට පමණයි."



කෑදර මීයා

මීයෙක් බිත්තියක් හාරා ගුලක් හදා ගත්තේය. දහවල් කාලයේ ගුලට වී සිටින මීයා රාත්‍රියේදී එළියට පැමිණ කෑම විශාල ප්‍රමාණයක් සොයා ගත්තා. මෙම මීයා හරිම කෑදරයි. ඌ උගේ බඩ පිම්බෙන තරමට ආහාර ගිල දැමුවා. එළිය වැටුණ පසු ඌට ආපසු ගුලට යාමට ඕනෑ වුණා. නමුත් උගේ ප්‍රමාණයට වඩා ආහාර ගෙන තිබූ නිසා උගේ බඩ පිම්බී තිබුණා. එම නිසා සිදුරෙන් රිංගා ආපසු ගුලට යාමට මීයාට නොහැකි වුණා.



නොගැලපෙන ආගන්තුකයා

දිනක් මීයෙක් ගෙම්බෙක්ව මුණ ගැසීමට ගියා. මීයාට ඇළකණ්ඩියේදී ගෙම්බාව මුණ ගැසුණා. ගෙම්බා දිය යට ඇති තම නිවසට පැමිණෙන ලෙස මීයාට ආරාධනා කළා. මීයාද ගෙම්බා සමඟ ගියා. නමුත් මීයා වතුරේ ගිලුණා. ඌ බොහෝම අමාරුවෙන් ජීවිතේ බේරාගෙන වතුරෙන් ගොඩට පැමිණියා.

" මම ආයේ කවදාවත් යන්නෑ ගෙම්බෙකුගේ අමුත්තෙක් විදියට නම් " මීයා හතිදමමින් පැවසුවා.

අසමගිය සහ ගෙදර

30

ගෙම්බෙක් සහ මීයෙක් රණ්ඩු කරන්නට පටන් ගත්තා. ඔවුන් තැනිතලා පිට්ටනියකට ගොස් දබර කරන්නට වුනා. මෙය දුටු බකමූණෙක් වටහා ගත්තා ඔවුන්ට තමාව අමතක වී ඇති බව. බකමූණා වේගයෙන් ඉගිළී අවුත් දෙදෙනාවම අල්ලාගෙන ගියා.

නගරයේ මීයා සහ ගමේ මීයා

නගරයේ සිටි මීයෙක් ගමේ සිටින තම යහළු මීයෙක්ව බැලීමට පැමිණියා. ගමේ මීයා ජීවත් වුණේ කුඹුරක් ළඟයි. ඌ නගරයේ මීයාට තමන් ළඟ තිබූ සියලුම ධාන්‍ය වර්ග කෑමට දුන්නා. නගරයේ මීයා කෑම ගැනීම මඳකට නතර කොට, " ඔබ බොහොම කෙට්ටුයි, ඒ ඔබ කන ආහාර පෝෂ්‍යදායක ඒවා නොවන නිසා. මම ඔබට ආරාධනා කරනවා නගරයට පැමිණෙන ලෙස." යැයි පැවසුවා.

ආරාධනාව පිළිගත්ත ගමේ මීයා නගරයට ගියා. ඔවුන් රෑ බෝවෙන තුරු ගුලට වී සිට රාත්‍රියේදී එළියට පැමිණ කෑම කාමරයට රිංගා ගත්තා. දෙදෙනාම එහි තිබූ කෑම මේසයට නැඟ ගත්තා. ගමේ මීයා කිසිදා නොදුටු කෑම වර්ග එහි පුරවා ගොඩගසා තිබුණා. 31

" ඔබ හරි " ගමේ මීයා කීවා. " අපි කන්නේ දුප්පත් කෑම. මමත් නුඹ සමඟ නගරයේ ජීවත් වෙන්නම්.

මෙසේ පවසනවාත් සමඟම නිවසේ නිවසේ සිටි මිනිසෙක් ඉටිපන්දමක් රැගෙන කාමරයට පැමිණ මීයන් පසුපස එළවන්නට වුණා. දෙදෙනාම බෙහොම අමාරුවෙන් පණ බේරාගෙන ගුලට රිංගා ගත්තා.

" නෑ " ගමේ මීයා කීවා. " ගමේ කුඹුරේ තිබෙන මගේ නිවස මට හොඳයි. මට රසවත් ආහාර නැති වුණත් මේ තරම් බයෙන් ජීවත් විය යුතු නැහැ."

කපටියා සහ ඔට්ටුව

එක් මිනිසෙක් අනෙක් අය සමඟ පුරසාරම් දොඩවමින් තමන්ට ගොඩක් බීමට හැකි බව කියා සිටියා.

" මට පුළුවන් මුළු මුහුදක්ම බීලා ඉවර කරන්නට." ඔහු කීවා.

" නුඹට බෑ " අනෙකෙකු ඔහුට කීවා.

" මට පුලුවන් මම ඒ වෙනුවෙන් රූබල් දාහක් ඔට්ටු අල්ලනවා.

පසුදින උදෑසන මිනිසුන් පැමිණ ඔහුට මෙසේ

පැවසුවා.

" යන්න ගිහින් ඔප්පු කරන්න. මුළු මූදම බීලා ඉවර කරන්නට පුළුවන් බව. එසේ කළහොත් අපි ඔබට රූබල් දාහක් දෙනවා."

" ඔව් මම එය කරනවා." මිනිසා මෙසේ පැවසුවා.

" නමුත් මම කිව්වේ නෑ ගංගාවල ඇති වතුර බොනවා කියා. ඔබලා ගිහින් ගංගා හා ඇළ දොළවල් මුහුදට වතුර ගලන එක නවත්වන්න. එවිට මම මුහුදේ ඇති සියලුම වතුර බොන්නම්."



34

අම්මා සහ ගින්දර

රාජාලියෙක් පැමිණ කුඩා නරි පැටවෙකු තම කූඩුවට ඔසවා ගෙන යාමට උත්සහ කළා. නරි පැටියාගේ මව නරි පැටියා ඉල්ලා බැගෑපත් වුණා. රාජාලියා මෙසේ කල්පනා කළා. '' ඇයට බෑ මට මුකුත් කිරීමට. මගේ කූඩුව තිබෙන්නේ පයින් ගසක් මුදුනේ. ඇයට එතැනට ළඟා වීමට බෑ. එසේ සිතූ රාජාලියා නරි පැටියාව රැගෙන ගියා.

නරි මව කුඹුරට පැමිණ ගිනි පෙළෙල්ලක්ද රැගෙන පයින් ගස ළඟට ගියා. මෙය දුටු රාජාලියා බියට පත්වී සමාව අයැද නරි පැටවා උගේ මවට ආපසු ලබා දුන්නා.

හොඳම ක්‍රමය සහ එකම උපාය

පූසෙක් බල්ලන්ගෙන් ප්‍රවේසම් වන ආකාරය පිළිබඳව නරියෙක් සමඟ කථාකලා.

" මම නම් බල්ලන්ට බය නෑ." පූසා කීවා. මම දන්නවා ඔවුන්ගෙන් බේරෙන්නට හොඳ උපායක්.

" ඔබ කොහොමද එක උපායකින් බල්ලන්ගෙන් බේරෙන්නේ ? මම දන්නවා උපායන් හැත්තෑ හතක්." නරියා ආඩම්බරයෙන් කීවා.

මෙසේ ඔවුන් කථා කරමින් සිටියදී දඩයම් බල්ලන් ශීඝ දෙනෙක් එනබව දුටුවා. පූසා උගේ එකම උපාය භාවිතා කරමින් හනි හනිකට ගසක් මතට නැගගත්තා. එම නිසා බල්ලන්ට පූසාව අල්ලාගන්නට නොහැකි වුණා. හරියා තමන් දන්න සියලුම උපායන් භාවිතා කළත් ඌට බල්ලන්ගෙන් ගැලවෙන්නට නොහැකි වුණා.

නායකයා සහ නායකත්වය

දිනක් කැළෑවේ සතුන් වඳුරාව තමන්ගේ නායකයා ලෙස පත්කර ගැනීමට තීරණය කළා. එවිට නරියා ඉදිරියට පැමිණ වඳුරාට මෙසේ පැවසුවා.

"ඔබ තමා දැන් අපේ නායකයා, මම කැළයෙන් නිධානයක් සොයා ගත්තා. එන්න මා සමඟ මම එය ඔබට පෙන්වන්නම්."

වඳුරා නරියා කිවූ දේ පිළිගෙන ඌත් සමඟ කැළයට ගියා. නරියා වඳුරාට උගුලක් පෙන්වා මෙසේ කීවා.

" මේ තියෙන්නේ නිධානයයි, ඔබ මුලින්ම එය ලබා ගන්න. ඔබ වැනි නායකයෙකු සිටියදී මා එය ගැනීම සුදුසු නෑ"

නායක වඳුරා උගේ ඉදිරි ගාත් දෙක උගුල මත තැබුවා. අසරණ වඳුරා උගුලට අසුවුණා. නරියා වහා ගොස් අනිත් සතුන් කැඳවාගෙන විත් උගුලට අසුවී සිටින වඳුරා පෙන්වා මෙසේ පැවසුවා.

"බලන්න ඔබලා තෝරාගෙන තිබෙන්නේ මොන විදියේ නායකයෙකුද කියා. මේ මෝඩ වඳුරා මෙම උගුලට අසුවුණා."

කියද්දී මෙහෙමයි කරන්නේ මෙහෙමයි.

මීයන්ට ඉතා නරක කාලයක් උදා වුණා. පූසා හැම දිනකම මීයන් දෙතුන් දෙනෙක්ව අල්ලා ගත්තා. මීයෝ සේරම එකතු වෙලා මේ අනතුරට කරන්නේ කුමක්දැයි සාකච්චා කළා. ඔවුන් කොපමණ කල්පනා කළත් හොඳ විසඳුමක් සොයා ගැනීමට නොහැකි වුණා. එහෙත් පුංචි මීයෙක් මෙසේ පැවසුවා.

" මම කියන්නම් කරන්න ඕනෑ දේ පූසා අපිව අල්ලා ගන්නේ අපි ඌ ළඟට එනකම් දන්නේ නැති නිසයි. අපි උගේ බෙල්ලේ සීනුවක් එල්ලමු. එතකොට ඌ ඇවිදින විට සීනුවෙන් සද්දයක් එයි. එවිට අපට දැනගන්න පුළුවන් පූසා ඉන්නේ කොහේද කියා.ඌ ළඟට එද්දි අපට දුවලා බේරෙන්න පුළුවන්."

" බොහොම අගෙයි " මහලු මීයෙක් පැවසුවා.

" නමුත් කවුද පූසාගේ බෙල්ලේ සිනුව එල්ලන්නේ? පුංචි මීයෝ උඹේ අදහස නම් හොඳයි. ඒත් අපි උඹට ස්තුති කරන්නේ උඹම ගිහින් පූසාගේ බෙල්ලේ සීනුව එල්ලුවොත් පමණයි."

විනාශයේ හඬ

දිනක් සිංහයෙක් දඩයමේ යනවිට කොටළුවෙකුද රැගෙන ගියා.

" ඔබ කැළයට යන්න. ගිහින් ඔබට පුළුවන් තරම් හයියෙන් කෑ ගහන්න. ඔබට තියෙන්නේ වේගවත් හඬක්. ඔබගේ කෑගැසීම ඇසී පළායන සත්තුන්ව මම අල්ලා ගන්නම්." සිංහයා කොටළුවාට පැවසුවා

කොටළුවා සිංහයා කී ආකාරයටම කළා. කොටළුවාගේ කෑ ගැසීම ඇසී සතුන් හිස් ලූ ලූ අත දිව ගියා. මෙසේ දුවන සත්තුන්ව සිංහයා දඩයම් කර ගත්තා.

" ඔබ ඉතා කදිමට කෑ ගසනවා" සිංහයා කොටළුවාට ප්‍රශංසා කළා. එතැන් පටන් අද වෙනතුරු කොටළුවන් කෑ ගසන්නේ කාගෙන් හෝ ප්‍රශංසාවක් ලබා ගැනීම සඳහායි.

වේලාවේ වරද

එක් වෘකයෙක් බල්ලන්ගෙන් බේරීම සඳහා ගුලකට රිංගුවා. නමුත් එහි නරියෙක් ලැගලා සිටියා. " පලයන් යන්න. මේ මගේ තැනයි" නරියා දත් විලිස්සා ඔරවමින් වෘකයාට කීවා.

වෘකයා වාද කළේ නෑ නමුත් මෙසේ පැවසුවා.

"බල්ලන් මා පසුපස එන්නේ නැතිනම් මම උඹට පෙන්වනවා මේ කාගේ තැනද කියා. නමුත දැනට පෙනෙන්නේ එය නිවැරදි බවයි."

මැක්කන් පළවා හැරීම

නරියාට මැක්කන්ගෙන් බොහෝ කරදර පීඩා සිදුවුණා. ඌ මේ කරදරයෙන් බේරෙන් විදියක් කල්පනා කළා. නරියා ගඟ ළඟට ගොස් වලිගය වතුරේ එබුවා. වලිගයේ සිටි මැක්කන් ටිකෙන් ටික නරියාගේ පසු පෙදෙසට පැමිණියා. ඉන්පසු නරියා උගේ කකුල් වතුරේ එබුවා. එවිට කකුල්වල සිටි මැක්කන් ඔක්කොම පිට මතට පැමිණියා. නරියා ටිකෙන් ටික වතුරේ ගිලෙද්දී මැක්කන් උගේ හොම්බ වෙතට පැමිණියා. නරියා සම්පූර්ණයෙන්ම වතුරේ ගිලුණා. එවිට උගේ හොම්බේ ඇලී සිටි මැක්කන් සියල්ල වතුරේ පාවුණා. මැක්කන් සියල්ලම ගං ඉවුරටම ගසාගෙන ගිය පසුව නරියා ගඟේ වෙනත් තැනකින් එතෙර වී කැළයට ගියා.

මේ සියල්ල බලා සිටි වෘකයාටද මැක්කන් පළවා හැරීමට ඕනෑ වුණා. ඌ කෙළින්ම පැමිණ ගඟට පැන්නා. වතුරේ ගිලී බොහෝ වේලාවක් සිටියා. වෘකයා සිතුවේ සියලුම මැක්කන් වතුරේ ගසාගෙන යන්නට ඇති බවයි. එහෙත් ඌ ගොඩට එද්දී ලෝමවල තදින් එල්ලී සිටි මැක්කන් නැවත ශක්තිමත් වී වෘකයාව සපාකන්නට වුණා.

වාසනාව සහ අවාසනාව

ගොවියෙක් තණකොළ කපන්නට තණ පිට්ටනියකට ගියා. එහිදී ඔහු හාන්සි වී කල්පනා කරමින් සිටින විට ඉබේම නින්ද ගියා. එම අවස්ථාවේ " වාසනාව" ඔහු සොයා පැමිණ මෙසේ පැවසුවා.

" මේ ගොවියා වැඩකළ යුතු අවස්ථාවේ නිදා සිටිනවා. කාළගුණය අයහපත් වීමට පෙර ඔහු පිදුරු එකතු කරන්නේ නෑ. කාළගුණය අයහපත් වූ විට ඔහු මට බනීවි මගේ අවාසනාව යැයි කියා"

පුංචි දෙයින් ලොකු පාඩමක්

පුංචි ගැහැණු ළමයෙක් බත් කූරෙක් අල්ලගෙන උගේ කකුල්වලින් අදින්නට වුණා.

එවිට ඇගේ පියා

" ඔය බත්කූරා තමයි රෑට මිහිරි හඬින් නාද කරන්නේ " යි පැවසුවා.

බත්කූරාගේ මිහිරි නාදය මතක් වී දැරිය ඌව අත හැරියා.

ආගන්තුක සත්කාරය

ඉත්තෑවෙක් පැමිණ තණකොළ සර්පයාගෙන් උගේ ගුලට වී ටිකක් විවේක ගන්නට අවසර ඉල්ලුවා. තණකොළ සර්පයා අවසර දුන්නා. ඉත්තෑවා ගුල තුල ඇවිදින විට කුඩා සර්ප පැටවුන්ගේ ඇඟේ ඉත්තෑ කූරු වැදී වේදනාවට පත්වුණා. එවිට තණකොළ සර්පයා මෙසේ පැවසුවා.

" ඔබ දැන් මගේ ගුලෙන් එළියට යන්න. ඔබේ ඉඳිකටු වැනි කූරු මගේ ළමයින්ගේ ඇඟේ වදිනවා. එය ඔවුන්ට වේදනාවක්"

එහෙත් ඉත්තෑවා සර්පයාගේ කථාව ගනන් නොගෙන මෙසේ පැවසුවා.

" මට කැමති නැති අය ඉන්නවා නම් ඔවුන්ට මෙහෙන් යන්නට පුලුවන්. මම නම් කැමති මෙහේ ඉන්නයි. මට මෙහේ හොඳයි.



උත්සාහය සහ ජයග්‍රහණය

කවුඩු පණික්කියෙක් වතුර පිපාසාවෙන් ඉන්නකොට පැන් කළයක් තිබෙනු දුටුවා. එහෙත් වතුර තිබුණේ කළයේ අඩියේයි. කවුඩු පණික්කියා මඳ වේලාවක් කල්පනා කොට කලයට ගල් කැබලි පුරවන්නට පටන් ගත්තා. වතුර ඉහළට එනතුරු කළයට ගල් පිරවූ පණික්කියා ඉන්පසු ඇති තරම් වතුර බීවා.

පුංචි වැරැද්ද සහ ලොකු දඬුවම

පුංචි කුරුල්ලෙක් ගසක් මත වාඩි වී සිටින විට පහළ තණබිමේ ධාන්‍ය ස්වල්පයක් තිබෙන බව දුටුවා. ඌ තණ බිමට ගොස් එම ධාන්‍ය කෑමට සිතුවා. එසේ සිතූ පුංචි කුරුල්ලා ධාන්‍ය කෑමට පහළට පියාඹා යද්දී දැලකට අසුවුණා.

" ඔක්කොම ඉවරයි "

පුංචි කුරුල්ලා පැවසුවා.

උකුස්සන් පහළට පැමිණ පුංචි කුරුල්ලන් දඩයම් කරගෙන ගියත් ඔවුන්ට කිසිම හිරිහැරයක් නෑ. නමුත් මා ධාන්‍ය ඇටයක් නිසා මේ දැලට අසුවුණා.



පුංචි බොරුව සහ ලොකු අලාභය

පුංචි ගොපලු කොළුවෙක් බැටළුවන් බලා ගනිමින් සිටියදී ගම්මුන් රැවටීමට සිතා " වෘකයා එනෝ, වෘකයා එනෝ, යැයි මහ හයියෙන් කෑ ගැසුවා.

කොලුවාගේ හඬට දිව ආ ගම්මුන් දැනගත්තා කොලුවා කෑගසා ඇත්තේ තමන්ව රැවටීමට බව. මේ ආකාරයට තුන් හතර වතාවක්ම ගම්මුන් කොලුවාගේ කෑ ගැසීමට රැවටුණා.

එහෙත් එක් දිනයක ඇත්තටම වෘකයා පැමිණ කොලුවාගේ බැටළුවෙක්ට පහර දුන්නා. "කවුරුවත් හැද්දෝ, වෘකයා ආවෝ " කියමින් කොලුවා උදව් ඉල්ලා කෑ ගැසුවා. එහෙත් ගම්මුන් සිතුවේ මෙයත් කොලුවාගේ තවත් රැවටීමක් වන්නට ඇති බවයි. එම නිසා ඔවුන් එදින පැමිණියේ නෑ. බොරුකාර ගොපලු කොලුවාගේ බැටළුවන් සියල්ලම වෘකයන් විසින් මරා දැමුවා.

කළගුණ සැලකීම

කුඹියෙක් කුඩා දොළ පාරක් අසලට වතුර ටිකක් බොන්නට ගියා. පුංචි රළ පහරක් ඇගේ වැදුණු කුඹියා වතුරට වැටුණා. දොළ පාරට ඉහළ අහසේ පියාසර කරමින් සිටි පරවියෙකු වතුරේ පාවෙමින් සිටි කුඹියාව දුටුවා. පරෙවියා දොළ පහර මතට පහත් වී හොටයේ තිබුණු අතු කැබැල්ලක් ළං කොට පරෙවියාව බේරා ගත්තා.

එම වෙලාවේ දඩයක්කාරයෙක් දැළක් එළා පරෙවියාව අල්ලා ගත්තා. දඩයක්කාරයා දැළ තද කරන විට කුඹියා ඔහුගේ කකුල සපා කෑවා. වේදනාවට පත් වූ දඩයක්කාරයා අතින් දැළ ගිලිහී වැටුණා. එවිට පරෙවියා දැලෙන් මිදී ඉක්මණින් අහසට නැග පියාඹා ගියා.

වෙස් වළා ගැනීම

කවුඩු පණික්කියා දුටුවා පරෙවියන්ට හොඳින් කෑම ලැබෙන බව. ඌ පරෙවියෙකු මෙන් සිරුර පාට කරගෙන පරෙවි කූඩුවට ගියා. පරෙවියන් සිතුවේ ඔහුත් පරෙවියෙකු බවයි. එම නිසා කූඩුවේ ඉන්නට ඉඩ හැරියා. එහෙත් තමන් කවුදැයි යන්න අමතක වූ කවුඩු පණික්කියා තමන්ගේ සුපුරුදු හඬින් නාද කරනන්ට පටන් ගත්තා.

රහස හෙළි වූ පසු පරෙවියන් කවුඩු පණික්කියාට කොටා කූඩුවෙන් පන්නා දැමුවා. ඌ නැවත කවුඩු පණික්කියන්ගේ කූඩුවට ගියත් සිරුරේ පරෙවියන්ගේ පාට ගාගෙන සිටි නිසා අනික් කවුඩු පණික්කියන් පරෙවි වෙස් ගෙන සිටි කවුඩු පණික්කියාට කොටා තම කූඩුවලින් ද පන්නා දැමුවා.

බැරි වැඩ නොකරන්

ඉබ්බෙක් තමන්ටත් පියාඹන්නට උගන්වන ලෙස රාජාලියාගෙන් ඉල්ලුවා. එය ඉබ්බෙක්ට කෙසේවත් කළ නොහැකි දෙයක් බව රාජාලියා කිව්වා. එහෙත් ඉබ්බා දිගින් දිගටම ඇවිට්ලි කළා. ඉබ්බාගේ කරදරයෙන් මිදෙන්නට බැරිතැන රාජාලියා ඉබ්බාව තම නියපොතු වලින් ඉහළ අහසට ගෙන ගොස් අත හැරියා. අසරණ ඉබ්බා ගල් පර්වතයක් මතට ඇද වැටී කෑලි වලට කැඩී මිය ගියා.

උරුමය සහ කරුමය

එකමත් එක කාලෙක එක් මිනිසෙකු ළඟ අශ්වයෙක් සහ බූරුවෙක් සිටියා. ඔවුන් ගමන් කරමින් සිටියදී බූරුවා අශ්වයාට මෙසේ පැවසුවා.

" යාළුවේ මේ භාණ්ඩ මට හුඟක් බරයි. කරුණාකරල මෙයින් ටිකක් ඔබ ගන්නවද ? එහෙත් අශ්වයා බූරුවාගේ ඉල්ලීම ප්‍රතිකෂ්ප කළා. අධික විඩාව නිසා බූරුවා අතරමඟදී මිය ගියා. ඉන්පසු මිනිසා සියලුම භාණ්ඩ අශ්වයාගේ පිට මත පැටෙව්වා. මියගිය බූරුවාගේ හමත් උගේ පිටමත තැබුවා.

''අහෝ මට සිදු වූ විපතක මහත සියලුම බර මට ගෙනයන්නට සිදුවෙලා. අපරාදේ මම බූරුවාට උදව් නොකළේ. දැන් මට උගේ හමත් අරන් යන්නට සිද්ධ වෙලා '' අශ්වයා කෑගැසුවා.

බලවතා සහ දුබලයා

නිදා සිටි සිංහයෙකුගේ ඇඟ මතින් මීයෙක් යද්දී සිංහයා මීයාව අල්ලා ගත්තා.

" අනේ සිංහ රාළහාමි මට යන්න දෙන්න. මමත් ඔබට කවදාහරි උදව් කරන්නම්." සිංහයා සිනාසී "

මේ පුංචි මීයා කොහොමද මට උදව් කරන්නේ?

යැයි කියා මීයාට යන්න දුන්නා. එයින් ටික දිනකට පසු දඩයක්කරුවන් විසින් සිංහයාව අල්ලාගෙන ගසක ගැටගසා තැබුවා. සිංහයාගේ ගෙරවිළි හඬ ඇසී පුංචි මීයා එතැනට දිව ආවා. මීයා වහාම සිංහයා ළඟට පැමිණ සිංහයා බැඳ තිබූ ලණු පොටවල් එකින් එක කපා දමා සිංහයාව බේරා ගත්තා.

" මතකද මම ඔබට උදව් කරන්නම් කීවාම ඔබ මට සිනාසුණා. ඔබ සිතුවේ මා පුංචි නිසා ඔබට උදව් කරන්නට බෑ කියා නේද? නමුත් දැන් තේරෙනවා නේද මීයන්ටත් හොඳ වැඩ කරන්න පුළුවන් කියා"

පුංචි මීයා සිංහයාට කිව්වා.

මසුරුකමේ විපාකය.

එක්තරා ගැහැණියකට කිකිළියක් සිටියා. කිකිළිය දිනකට එක බැගින් සැමදා බිත්තර දැමුවා. මෙම ගැහැණිය ඉතා මසුරු තැනැත්තියක් වුණා. කිකිළියට වැඩිපුර කෑම දුන්නොත් වැඩියෙන් බිත්තර දමයි කියා ඈ සිතුවා. එහෙත් වැඩිපුර දුන් කෑම කා තර වූ කිකිළිය බිත්තර දැමීම සම්පූර්ණයෙන් නතර කළා.

මිනිසා සහ රන් බිජුව.

එක් මිනිසෙකුට රත්තරන් බිත්තර දමන කිකිළියක් සිටියා. කිකිළිය සැමදා දිනකට එක බැගින් රන් බිත්තර දැමුවා. එකවර රත්රන් ගොඩක් ලබා ගැනීමේ තණ්හාවෙන් මිනිසා කිකිළිය මැරුවා. මෝඩ මිනිසා සිතුවේ කිකිළිය රන් බිත්තර දමන්නේ බඩේ රත්රන් ගොඩක් තිබෙන නිසා බවයි. එහෙත් කිකිළියගේ බඩේ රත්රන් තිබුණේ නෑ. ඇයත් අනෙක් කිකිළියන් වැනිම වූ කිකිළියක් පමණයි.

ප්‍රශංසාව හා උගුල..

බල්ලෙක් සහ කුකුළෙක් ගමනක් යමින් සිටියා. අතරමඟ රෑ බෝ වූ නිසා ගමන නවතා නිදාගන්නට සිතුවා. කුකුළා ගසක් මතට නැගගත් අතර බල්ලා ගස මුල නින්දට වැටුණා.

උදේ පාන්දර කුකුළා හැඬලුවා. නරියෙකුට මෙම ශබ්දය ඇසී එතැනට පැමිණ මෙසේ පැවසුවා.

" යාළුවේ ඔබට තිබෙන්නේ ඉතා මිහිරි කටහඬක්. මා සිතුවා ඔබට ප්‍රශංසා කළ යුතුයි කියා. ඒ නිසා කරුණාකර පහළට බහින්න."

" ඉස්සෙල්ලාම මගේ ආරක්ෂකයා අවදි විය යුතුයි. ඔහු ගහමුල නිදාගෙන ඉන්නේ. ඔහු ඇහැරුණහම මම පහළට එන්නම්."

කුකුළා කිව්වා.

බල්ලා දුටු නරියා බියට පත්වී කෑ ගැසුවා. නරියා ගේ කෑ ගැසීම ඇසී අවදි වූ බල්ලා නරියාව මරා දැමුවා.

ආශාව සහ විනාශය.

මුගටියෙක් කම්හලකට ගොස් තඹ වලින් සෑදූ පීරක් දැක එය ලෙවකන්නට වුණා. මුගටියාගේ දිව කැපී දිවෙන් ලේ ගලන්නට වුණා. මුගටියා සිතුවේ පීරෙන් ලේ ගලන් බවයි. ඌ තව තවත් පීර ලෙව කෑවා. මෙසේ මුගටියා උගේ මුළු දිවම විනාශ කර ගත්තා.

අතරමැදියා.

සිංහයෙක් සහ වළහෙක් මස් කැබැල්ලකට රණ්ඩු කරන්නට පටන් ගත්තා. වළහවත්, සිංහයාවත් පැරදෙන්නට කැමති වුණේ නෑ. දෙදෙනාම බොහෝ වේලාවක් සටන් කර කෙළින් සිට ගැනීමටත් බැරි තරමට වෙහෙසට පත් වුණා. මේ දෙස බලාගෙන සිටි නරියෙක් වහාම දුවගෙන විත් මස් කැබැල්ල ඩැහැගෙන පලා ගියා.

මිනිසුන්ගේ හැටි.

වෘකයෙක් කෑම සොයා යමින් සිටියා. නිවසක් අසළින් යමින් සිටියදී අඬමින් සිටින කුඩා දරුවෙකුට මැහැල්ලක් මෙසේ කියනු ඇසුණා.

" ඔබ ඇඬිල්ල නැවැත්තුවේ නැත්නම් මම ඔබව වෘකයාට කන්නට දෙනවා."

වෘකයා මහත් සතුටට පත් වී කුඩා දරුවාව දෙන තුරු නිවස අසලට වී බලා සිටියා. දහවල ගෙවී රෑ බෝ වුණා. වෘකයා තවමත් නිවස අසලට වී බලා සිටිනවා. ඌට නැවත වරක් මැහැල්ල මෙසේ කියනු ඇසුණා.

" අඬන්න එපා මගේ පැටියෝ මම ඔයාව වෘකයාට කන්නට දෙන්නේ නෑ. වෘකයා ආවොත් අපි එකපාරින්ම ඌව මරා දමමු."

කළකිරීමට පත් වෘකයා මෙසේ සිතමින් යන්නට ගියා.

" මිනිසුන් කියන්නේ එක දෙයක්, නමුත් කරන්නේ තවත් දෙයක්.



කෑම සහ විනෝදය.

සරත් කාලයේදී කූඹින් ආහාරයට ගන්නේ ඔවුන් වසන්ත කාලයේදී එක් රැස්කරගත් ධාන්‍යයි. දිනක් බත් කූරෙක් පැමිණ කූඹින්ගෙන් ආහාර ටිකක් ඉල්ලුවා.

"ඇයි ඔබ වසන්ත කාලයේදී ධාන්‍ය රැස්කරගන්නේ නැත්තේ ?"

කූඹින් ඇසුවා.

"ඇත්තෙන්ම මට වෙලාවක් තිබුණේ නෑ. මම ඒ කාලයේ සිටියේ සින්දු කියමින්." බත්කූරා පැවසුවා.

කූඹි රැල මහ හඬින් සිනාසී බත්කූරාට මෙසේ කීවා.

" ඔබ වසන්ත කාලයේ සින්දු කීවා නම් ශීත කාලයේදී නට නටා ඉන්න.

ගෙම්බා සහ සිංහයා

දවසක් සිංහයෙක් දඩයමේ යමින් සිටිය දී මහ හඬින් බක, බක ගා කෑ ගසන හඬක් ඇසුණි, වට පිට බැලූ සිංහයා ඒ ගැන විපරම් කර බැලුවේ ය.

මේ තරම් විශාල හඬක් නැගීමට නම්, ඒ විශාල සතෙක්ම විය යුතු බවයි. එසේ සිතා වට පිට බලමින් සිටි සිංහයාට හදිසියේම වගුරු බිමේ සිට එහේ මෙහේ පනින ගෙම්බෙක් දැක ගත හැකි විය කේන්තියට පත් සිංහයා තම කකුලෙන් ගෙම්බා පාගා දමා

"බලසම්පන්න ඇත්තෝ බය කරන්නේ මේ වගේ කුරුම්ට්ටෝ" යැයි කීවේ ය



III

උපකාරය.

වෘකයෙක් මස් කටුවක් තම උගුරේ හිරවීම නිසා මහත් වේදනාවට පත්ව සිටියා. වෘකයා කොකාගෙන් මෙසේ ඉල්ලා සිටියා.

" අනේ කොක් හාමි උඹේ ඔය දිගු හොටය මගේ උගුරට දාලා හිරවී ඇති කටුව අරන් දීපන්. මම උඹට තෑග්ගක් දෙන්නම්."

කොකා කටුව අරන් දමා වෘකයාගෙන් තෑග්ග ඉල්ලා සිටියා.

" ඔබේ බෙල්ල මගේ කට ඇතුලේ තිබියදී මම එය කඩා නොගැනීම ඔබට දෙන ලද හොඳම තෑග්ගයි. වෘකයා කොකාට පැවසුවා.



වැඩ සහ අවැඩ.

එක් ධනවත් කාන්තාවක් පාන්දර කුකුලාගේ කෑ ගැසීමත් සමඟම තම වැඩකාරියන්ව අවදි කරවා බොහෝ රෑ වෙන තුරු ඔවුන්ගෙන් වැඩ ගත්තා. වැඩකාරියන් මෙයින් අසතුටට පත් වී කුකුළාව මරා දැමීමට තීරණය කලා. එහෙත් එය ඔවුන්ගේ නරකටම හේතු වුණා. වැඩකාරියන් පමණට වඩා නිදාගනිතැයි බිය වූ නිවැසි කාන්තාව ඔවුන්ව පෙරටත් වඩා පාන්දරින් අවදි කලා.

තණ්හාව සහ ආශාව.

බල්ලෙක් මස්කටුවක් රැගෙන ඒදණ්ඩ මතින් ගමන් කරමින් සිටියා. ඌ ඒ දණ්ඩෙන් පහළ බැලුවිට තවත් බල්ලෙක් මස් කටුවක් රැගෙන යනු දුටුවා. බල්ලා සිතුවේ නෑ මේ තමන්ගේම හෙවනැල්ල බව. බල්ලාට වතුරේ සිටි බල්ලාගේ කටේ තිබූ මස් කටුවක් ගැනීමට උවමනා වුණා. ඌ තමන්ගේ කටේ තිබූ මස් කටුව ඉවත දැමුවා. එවිට වතුරේ සිටි බල්ලාගේ කටේ තිබූ මස් කටුවේ ඡායාවද නොනේ ගියා. බල්ලා තමාගේ මස් කටුව නැති කරගෙන හිස් අතින්ම ගෙදර ආවා.



පුරුද්ද සහ බුද්ධිය

"තාත්තේ ඔබ බල්ලන්ට වඩා ලොකුයි. වේගයෙන් දුවන්නටත් පුළුවන්. ඔබගේ විශාල අං දෙක ඔබව ආරක්ෂා කරනවා. ඉතින් ඇයි ඔබ බල්ලන්ට ඔය තරම් බය."

මුව පැටියෙක් තම පියාගෙන් ඇසුවා.

මුව තාත්තා සිනාසී පැටියාට මෙසේ පැවසුවා.



"ඒක ඇත්ත මගෙ පුතේ බල්ලන්ගේ බිරීම ඇසෙන විට මා සිතීම නවතා දුවන්නට පටන් ගන්නවා."

තිත්ත මිදි

නරියෙක් වැළක තිබූ මිදි පොකුරක් දුටුවා. කොතරම් උඩ පැන්නත් නරියාට මිදි පොකුර ලබා ගැනීමට නොහැකි වුණා. අන්තිමේදී "ඒ මිදි තිත්ත ඇති"යි කියමින් නරියා යන්නට ගියා.



වෙන වැඩ සහ නොවෙන වැඩ.

කිකිළියක් නයි බිත්තර කිහිපයක් දැක ඒවා රකින්නට පටන් ගත්තා. වැහිලිහිණියෙක් මෙය දැක කිකිළියට මෙසේ පැවසුවා.

"මෝඩ වැඩ කරන්නට එපා. ඔය බිත්තර වලින් නයි පැටවුන් ඇවිල්ලා උන් මුලින්ම නුඹව කා දමාවි. "

රැවටීම සහ වැනසීම.

එක් බූරුවෙක් සිංහ හමක් පොරවගෙන මිනිසුන් හා සතුන්ව බිය ගැන්වුවා. මිනිසුන් සිංහවෙස් ගත් බූරුවාට බයේ පැන ගියා. එහෙත් ඒ වෙලාවේ සුළඟක් හැමූ නිසා සිංහ හම බූරුවාගේ ඇගෙන් ගිළිහී ගියා. තමන්ව බියකර ඇත්තේ බූරුවෙක් බව මිනිසුන් දැන ගත්තා. ඔවුන් බූරුවාට හොඳ හැටි පහර දී එළවා දැමුවා.

නිධානය තිබෙන තැන.

උයන් පල්ලෙකුට තම පුතුන්ට ගෙවතු වගාව පිළිබඳව උගන්වන්නට උවමනා වුනා. ඔහු මැරෙන මොහොතේ දරුවන් කැඳවා මෙසේ පැවසුවා.

"දරුවෙනි, මා මළ පසු ඔබලා ගිහින් බලන්න. මේ මිදිවත්තේ මා සඟවා ඇත්තේ මොනවාද කියා."

දරුවන් සිතුවේ පියා මිදිවත්තේ නිධානයක් වළලා ඇති කියලයි. පියාගේ මළගමට පසු ඔවුන් මුළු මිදි වත්තම හාරා නිධානය සෙවුවා. ඔවුන්ට කිසිදු නිධානයක් හමු වුනේ නෑ. එහෙත් පස් පෙරළා දැමූ නිසා පස සාරවත් වී මිදි ඵලදාව දෙගුණයකින් පමණ වැඩිවී ඔවුන් පොහොසතුන් බවට පත්වුණා.

පිපාසයේ ගැඹුර.

පිපාසයට පත් වූ එළුවෙක් දිය බීමට ළිඳකට බැස්සා. ඇති තරම් වතුර බිව් එළුවා ආපසු ගොඩට ඒමට සූදානම් වුනා. එහෙත් වතුර බී බර වැඩිවී සිටි එළුවාට ගොඩට ඒමට නොහැකිව කෑ ගැසුවා. ළිඳ ළඟින් යමින් සිටි නරියෙකුට එළුවාගේ හඬ ඇසී විපරම් කළා. සිද්ධිය දැනගත් පසු නරියා එළුවාට මෙසේ පැවසුවා.

"උඹේ ඔය ඔළු ගෙඩිය ඇතුලේ උඹේ රැවුල් ගස් තරම්වත් මොළයක් තිබුණානම් පනින්න කලින් උඹට හිතන්න තිබුණා නේද ගොඩට එන්නේ කොහොමද කියලා"

කොකා සහ මාන කොකා.

තම කුඹුරේ ධාන්‍ය කන මාන කොකුන් ඇල්ලීමට මිනිසෙක් දැලක් එළුවා. මෙසේ අල්ලාගත් මාන කොකුන් අතරේ කොකෙක්ද සිටියා. කොකා මිනිසාට මෙසේ පැවසුවා.

''මට යන්න දෙන්න, මම මාන කොකෙක් නොවේ. මම කොකෙක්. අපි වැදගත් කුරුල්ලන් වර්ගයක්. බලන්න මගේ පිහාටු දිහා. මම ජීවත්වෙන්නේ ඔබේ පියාගේ නිවසේ වහළය මත''

''මම ඔබව අල්ලා ගත්තේ මාන කොකුන් සමඟ. ඒ නිසා උන් සමඟ උඹවත් මරා දමනවා.'' මිනිසා කිව්වා.

අද සහ හෙට.

ධීවරයෙක් පුංචි මාළුවෙකුව අල්ලා ගත්තා. එවිට පුංචි මාළුවා ධීවරයාට මෙසේ කිව්වා.

"අනේ මාව නැවත වතුරට දාන්න. බලන්න මා කොතරම් පුංචි ද කිවා. එහෙත් ඔබ මට යන්නට දුන්නොත් මම තවත් ලොකු මහත් වේවි. එතකොට ඔබ මාව අල්ලා ගන්න. එවිට ඔබට මගෙන් ලොකු ප්‍රයෝජනයක් ලැබේවි."

"මා එතරම් මෝඩ නෑ. වතුරේ ඉන්න ලොකු මාළුවාට වඩා අතේ ඉන්න පුංචි මාළුවා මට වටිනවා." ධීවරයා පැවසුවා.

86

හවා සහ ගෙම්බා.

කැලේ සිටින හාවුන් සියලු දෙනාම එක් රැස් වී ඔවුන්ගේ ඉරණම ගැන කථාකර ශෝකයට පත්වුණා.

"බලන්න අපි කොච්චර බයෙන්ද ජීවත් වෙන්නේ ? මිනිස්සු, බල්ලෝ, උකුස්සෝ මේ ඔක්කොම හදන්නේ අපිව මරාගෙන කන්නයි. මෙහෙම ජීවත් වනවාට වඩා හොඳයි මැරෙන එක. " මෙසේ පවසා ඔවුන් දියේ ගිලී මැරෙන්නට සිතා විල දෙසට දුවගෙන ආවා.

හාවන් දිව එන ශබ්දය ඇසී විලේ ඉවුරේ සිටි ගෙම්බන් බිය වී වතුරට පැන්නා. මෙය දුටු එක් හාවෙක් මෙසේ පැවසුවා. "යහළුවනේ පොඩ්ඩක් නවතින්න. අපි දියේ ගිලී ජීවිත නැතිකරගත යුතු නෑ. ගෙම්බන්ගේ ජීවිතය අපටත් වඩා ශෝක ජනකයි. ඔවුන් අනිත් සතුන්ට මෙන්ම අපටත් බියෙන් ජීවත් වෙන්නේ.

IV

වලිගය නැති නරියා.

දිනක් නරියෙක්ව උගුලකට අසුවී උගේ වලිගය ඌට අහිමි වුනා. වලිගය අහිමි වීමේ ලැජ්ජාව වසා ගැනීමට ඌ උපායක් කල්පනා කොට අනික් නරියන් ලඟට ගොස් මෙසේ පැවසුවා,

''වලිගය කියන්නේ අපට අමතර බරක්, එය තිබීමෙන් සිදුවන්නේ අපට කරදරයක්, එමනිසා මම මාගේ වලිගය කපා දැමුවා, දැන් මට දැනෙන්නේ ලොකු නිදහසක්, ඔබලාත් මා මෙන්ම ඔබලාගේ වලිගය කපා දමන්න'

එවිට අනෙක් නරියන් මෙසේ පැවසුවා,

''ඔබ ඔහොම කවදාවත් කියන්නේ නෑ ඔබේ වලිගය අහිමි නොවුනනානම්''

වලිගය අහිමි වූ නරියා වචනයකුදු නොදොඩා එතැනින් ලිස්සා ගියා.

මදුරුවා සහ සිංහයා.

මදුරුවෙක් සිංහයෙක් ළඟට පැමිණ මෙසේ පැවසුවා

ඔයා හිතන්නේ ඔබ තරම් ශක්තිවන්තයෙක් නෑ කියාද? ඔබ සම්පූර්ණයෙන්ම වැරදියි. මා ඔබට වඩා ශක්තතිමත්. ඔබ කරන්නනේ නිය වලින් සූරන එක යි දත් වලින් හපන එක පමණයි, හරියට කාන්තාවක් වගේ. ඒත් මා ඔබට වඩා ශක්තිමත් අපි සටන් කරලා බලමුද?''

මදුරුවා රෑං පෙත්තක මෙන් හඬක් නංවමින් සිංහයාගේ නාසය සහ මුහුණ සපන්නට වුනා. සිංහයා උගේ දෑත් වලින් මුහුණෙන් ලේ එනතුරුම කසන්නට වුනා. ඌව දැඩි වෙහෙසට පත්වුනා.

පුංචි මදුරුවා ජයග්‍රාහී හඬක් නංවමින් එතැනින් ඉගිල යද්දී ඌව මකුළු දැලක පැටළුනා. මරණය පෙනී පෙනී ඌ මෙසේ සිතුවා,

"සිංහයෙකු වැනි දරුණු සතෙකුව මට පරාජය කරන්නට හැකි වුවත් මේ කුඩා මකුළුවෙකුගේ ආහාරය බවට පත්වන්නට මට සිදුවුනා."

ප්‍රමාදය පසු තැවිල්ලට හේතු වේ.

දිනක් මිදුලේ නිදමින් සිටි බල්ලකුව වෘකයෙකුට අසුවුනා. එවිට බල්ලා වෘකයාට මෙසේ පැවසුවා.

''අනේ රාළහාමි මම දැන් ඉතාමත් කෙසඟ යි. නමුත් ළඟදීම මගේ ස්වාමියාගේ නිවසේ මඟුල් උත්සවයක් තිබෙනවා. එහිදී මට හොඳට ආහාර ලැබී මා පුෂ්ඩිමත් වේවි. එමනිසා තව ටික දිනකින් පැමිණ මාව ආහාරයට ගන්න.''

වෘකයා මෙය විශ්වාස කර එතැනින් පිටත්ව ගියා.

ඊට සතියකට පමණ පසු වෘකයා පැමිණයා. නිවසේ වහලයේ නිදා සිටි බල්ලාගෙන් ඌ ඇසුවා නිවසේ සාදය අවසන්ද කියා, එවිට,

''මේ අහපන් වෘකයෝ, අනික් දවසේ මා මිදුලේ නිදා සිටින විට මාව ගිල දැමීමට මඟුල් උත්සවයක් අවසන් වනතුරු සිටින්නට එපා'' බල්ලා පැවසුවා.

සිනිඳු බවේ රහස.

කැලෑ අශ්වයෙක් දුටුවා හීලෑ අශ්වයෙක්ගේ සම ඉතා සිනිඳුව දීප්තිමත්ව තිබෙන ආකාරය සහ ඌ ආහාරයට ගන්නා ඉතා අනර්ඝ ආහාර. නමුත් ටික වේලාවකින් උගේ ස්වාමියා පැමිණ හීලෑ අශ්වයාගේ පිටමත මහා බරක් පටවා ඌව නගරයට රැගෙන ගියා. මෙය දුටු කැළෑ අශ්වයාට මෙසේ කියැවුනා,

"සහෝදරයා මම තවදුරටත් ඔබව වර්ණනා කරන්නේ නෑ, මා දුටුවා ඔබ ඒ වෙනුවෙන් කොපමණ වටිනාකමක් එයට ගෙවනවාද කියා."

අශ්වයා සහ උගේ හාම්පුතා.

උයන් පල්ලෙකුට අශ්වයෙක් සිටියා. ඔහු අශ්වයාට ගොඩක් වැඩ පැවරුවද කෑම දුන්නේ ස්වල්පයයි. මේ නිසා අශ්වයා තමන්ට වෙනත් හාම්පුතෙකු ලබාදෙන ලෙස දෙවියන්ගෙන් ඉල්ලුවා. දෙවියන් වහන්සේ අශ්වයාගෙ කන්නලව්වට කන්දුන්නා. උයන්පල්ලා අශ්වයාව කුඹල්කරුට විකිණුවා. අශ්වයා සතුටට පත් වුනා. එහෙත් කුඹල්කරුවා ඌට ඊටත් වඩා වැඩ දුන්නා. නමුත් ආහාර දුන්නේ ස්වල්පයයි.

අශ්වයා නැවත් හොඳ හාම්පුතෙකු ලබාදෙන මෙන් දෙවියන්ගෙන් ඉල්ලා සිටියා. දෙවියන් වහන්සේ නැවතත් මොහුගේ ඉල්ලීමට ඇහුම්කන් දුන්නා. කුඹල්කරුවා අශ්වයාව හම් මසන්නාට විකුණුවා. හම් මසන්නාගේ මිදුලේ තිබූ හම් තොගය දැක අශ්වයා බියට පත් වී මෙසේ පැවසුවා.

" අහෝ, මට වුන විපත්තිය. ඇයි මම මගේ පරණ හාමුපුතුන් ළඟ හිටියේ නැත්තේ ? දැන් මාව විකුණා ඇත්තේ මගෙන් වැඩ ගැනීමට නොවෙයි මගේ හම ලබාගැනීම සඳහායි"

වෘකයා සහ එළුවා.

වෘකයෙක්, එළුවෙක් කඳු ගැටයක් මත තණකොළ කමින් සිටින අයුරු දුටුවා. එහෙත් වෘකයාට එතැනට ළඟා වීමට හැකියාවක් තිබුනේ නෑ.

" ඇයි ඔබ පහලට එන්නැත්තේ, පහළ තණකොළ ඉතා ප්‍රණීතයි'' වෘකයා කිව්වා.

එවිට එළුවා මෙසේ කිව්වා.

"නුඹ මට පහළට එන්න කියන්නේ ඒ නිසා නෙවෙයි. නුඹ කරදර වෙන්නේ නුඹේ බඩගින්න ගැනයි. මගේ බඩගින්න ගැන නොවෙයි."

ගෝනා සහ අං තට්ටුව.

එක් ගෝනෙක් වතුර බොන විට උගේ ඡායාව වතුරෙන් දැක මෙසේ සිතුවා. '' මගේ අං දෙක කෙතරම් පියකරුද, විශාලද නමුත් මගේ කකුල් හරියට ගිනිකූරු වගෙයි.

මෙසේ සිතමින් සිටියදී හදිසියේම සිංහයෙක් එතැනට ආවා. ගෝනා පිට්ටනිය දිගේ කිසි කරදරයක් නැතිව දුවගෙන ගොස් සිංහයා ගෙන් බේරුණා. එහෙත් කැළයට ගිය පසු උගේ විශාල අං තට්ටුව ගස්වැල පැටලීම නිසා ඌට දුවගැනීමට නොහැකි වුණා. සිංහයා
 පැමිණ ගෝනාව අල්ලා ගත්තා. මරණය පෙනී පෙනී ගෝනා මෙසේ පැවසුවා.

'' මම කොතරම් මෝඩයෙක්ද? මම අගය කරපු නැති දේ මාව මරණයෙන් බේරා ගත්තා. නමුත් මම ආඩම්බර වූ අං තට්ටුව නිසා මට මරණය ළඟා වුණා.

ගෝනා සහ මිදිවත්ත.

දඩයක්කරුවන්ගෙන් බේරීමට සිතා ගෝනෙක් මිදිවත්තක සැඟවුණා. දඩයක්කරුවන් ගිය පසු ළඟ මිදි අතු කෑමට පටන් ගත්තා. නැවතත් පැමිණි දඩයක්කරුවන් මිදි අතු සෙළවෙනු දැක ගෝනාව අල්ලා ගත්තා.

" මාව බේරාගත් මිදි වත්තේ කොළ කෑවාට මට මෙය යස පාඩම " යි මරණ බියෙන් සිටි ගෝනා පැවසුවා.

මහල්ලා සහ මරණය.

දර විශාල ප්‍රමාණයක් එකතු කරගත් මහල්ලෙක් ඒවා ගෙදර ගෙන යමින් සිටියදී මහන්සියට පත්ව මෙසේ පැවසුවා.

" අහෝ මරණයවත් පැමිණියා නම් කොතරම් හොඳයිද? " මෙවෙලේ මරණය ඔහු වෙත පැමිණ මෙසේ පැවසුවා.

" මෙන්න මා පැමිණියා නුඹට මොනවාද ඕනෑ ? මහල්ලා බියට පත්වී මෙසේ කිව්වා

"පුළුවන්නම් මේ දර ටික ගෙනියන්න උදව් කරන්න"

සිංහයා සහ නරියා.

සිංහයෙක් මහලු තත්වයට පත්වී දඩයමක්වත් කරගැනීමට නොහැකි තත්වයට පත්වී ගුහාවට වී වැතිරී
100 සිටියා.

සිංහයාව බලන්නට පැමිණි සතුන්ව ඌ ගුහාවේදීම අල්ලාගෙන ආහාරයට ගත්තා. දිනක් නරියාද සිංහයාව බලන්නට පැමිණියා. නමුත් ඌ දැනගත්තා ඇතුළට යන සතුන්ට වෙන දේ පිළිබඳව. එම නිසා ඈතින් සිට සිංහයාගෙන් මෙසේ ඇසුවා.

" ඉතින් කොහොමද දැන් සනීපද?

" නෑ එතරම් සනීපයක් නෑ ඇයි ඔබ ඇතුළට එන්නේ නැත්තේ"

"ඇත්තම කියනවානම් මම දැක්කේ ගුහාව ඇතුළට ගිය සතුන්ගේ අඩි සටහන් පමණයි. නැවත එළියට ආ අඩි සටහන් දැක්කේ නෑ"

බළල් උපාය සහ මී නුවණ.

එක්තරා නිවසක මීයන් ගොඩක් සිටියා. මේ කරදරයෙන් මිදෙන්න නිවැසියන් ගෙදරට පූසෙක් ගෙනාවා. පූසා බඩගාගෙන ගොස් මීයන් ඇල්ලුවා. පූස් රාළගෙන් බේරෙන්නට වහළයේ සිවිලිම මත ලගින්නට මීයෝ ටික තීරණය කළා.

මීයන් වහළයෙන් බිමට නොබසින බව දැනගත් පූස්රාළ උන්ව බිමට ගෙන්වා ගැනීමට උපායක් කල්පනා කළා. ඌ එක් අතක් සිවිලිම තුලට දමා එල්ලී මැරී සිටින ආකාරයට සිටියා. නමුත් මෙය පූසාගේ උපායක් බව දැනගත් මී පැටවෙක් මෙසේ කීවා.

"සහෝදරයා උඹ ඔහොම නෙවෙයි ගෝනියක සිටියත් මම නම් උඹ ළඟින් යන්නේ නෑ"



V

මොළයක් නැති 'මහ රජා'.

කාක්කෙකුට මස් කැබැල්ලක් හමුවුනා. ඌ එය කෑමට අත්තක් මත ඉඳගත්තා. නරියෙක් මෙය දැක කාක්කා ළඟට පැමිණ මෙසේ කීවා.

"ආයුබෝවන් කාක්කෝ, නුඹ නම් නියම කඩවසම් පුද්ගලයෙක්. නුඹේ ඔය උස සහ පෙනුම නිසා නුඹ හරියට මහරජතුමෙකු වගේමයි. නමුත් නුඹ නියම මහරජතුමෙක් ද කියලා බලන්නට නුඹේ කටහඬත් පොඩ්ඩක් අහන්නට ආසයි'

මේ මොළයක් නැති කාක්කා නරියාගේ කීමට රැවටී උගේ මුළු ශක්තියම යොදා කෑ ගැසුවා. උගේ කටේ තිබූ මස් කැබැල්ලද බිමට වැටුණා. නරියා එය ඇහිඳගෙන මෙසේ කියා යන්නට ගියා.

"අනේ කාක්කෝ උඹට මහරජතුමෙක් වෙන්නට පුළුවන් හැබැයි ඒකට මොළේ ටිකකුත් තියෙන්නට ඕනේ"

වළහා කීව රහස.

මිතුරන් දෙදෙනෙකු කැළයක් මැදින් ඇවිදිමින් සිටියදී වළහෙක් ඔවුන් පසුපස එළවගෙන ආවා. එක්කෙනෙක් ගහක් මතට නැග ගත්තා. එහෙත් අනෙකාට ගස් නගින්නට නොහැකියි. ඔහු කිරීමට කිසිවක් නැතිව මැරුණු ආකාරයක් පෙන්වා බිම වැතිරුණා.



වළහා ඔහු ළඟට පැමිණ ඉවකලා. කොලුවා හුස්ම ගත්තේවත් නැති නිසා වළහා සිතුවේ ඔහු මැරී ඇති කියායි. වළහා යන්නට ගියා.

වළහා ගියපසු ගසමත සිටි යාළුවා පැමිණ

" වළහා මොකද කීවේ ? "යි ඇසුවා

"ඌ කිව්වා විපතේදී තම මිතුරාව අත්හරින කෙනා නියම මිතුරෙක් නොවෙයි කියා."

අනෙකා උත්තර දුන්නා.

106

අවංකකමේ තෑග්ග.

දර කපමින් සිටියදී එක් මිනිසෙකුගේ පොරව ගඟට වැටුණා. ඔහු කරගත දෙයක් නොමැතිව ගං ඉවුරේ අඬ අඬා සිටියදී දිය රකුසෙක් පැමිණ "අඬන්නේ මොකදැයි' ඇසුවා."

දර කපන්නා සිද්ධිය පැවසූ පසු ඔහු ගැන දුකක් ඇතිවී දිය රකුසා දිය යටින් රත්තරන් පොරවක් ගෙනවිත්'' මෙයද ඔබේ පොරව'' යි ඇසුවා.

''නෑ මෙය නොවෙයි'' මිනිසා කිව්වා.

නැවත රකුසා රිදී පොරවක් ගෙනැවිත්

''එසේනම් මෙයද?'' ඇසුවා.

''නැහැ නැහැ ඕකත් මගේ නෙවෙයි.'' මිනිසා කිව්වා.

ඉන්පසුව දිය රකුසා ඔහුගේ සැබෑ පොරව ගෙනවිත් දී අවංකකමට තෑග්ගක් වශයෙන් රත්තරන් හා රිදී පොරෝ දෙකම දුන්නා.

සතුටට පත්වූ දරකපන්නා ගමට ගොස් සිද්ධිය පිළිබඳව යහළුවන්ට කීවා.

මෙය අසා සිටි එක් පුද්ගලයෙක් පසුදින දරකපන්නට ගොස් ඕනෑකමින්ම පොරව ගඟට විසිකොට අඬන්නට පටන් ගත්තා. දිය රකුසා නැවතත් පැමිණ කාරණය දැනගෙන ගොස් රත්තරන් පොරවක් ගෙනැවිත්

''මෙය උඹේ පොරවද?''යි ඇසුවා.

තණ්හාවෙන් පිරුණු මේ පුද්ගලයා ගත් කටටම 'ඔව් ඔය තියෙන්නේ මගේ පොරොව' කිව්වා.

එහෙත් දිය රකුසා දැනගත්තා මෙය බොරුවක් බව. එමනිසා රත්තරත් පොරොවවත් ඔහුගේ පොරොවවත් දුන්නේ නෑ.

බඩගිනි වෘකයා සහ අහිංසක බැටළු පැටියා.

වෘකයෙක් කුඩා දොළ පහරක් අද්දර වතුර බොමින් සිටින බැටළු පැටියෙක්ව දුටුවා.

වෘකයාට බැටළු පැටියාව මරාගෙන කන්නට ඕනෑ වී ඌත් සමඟ රණ්ඩුවක් ඇතිකර ගැනීමට සිතුවා.

" ඇයි උඹ වතුර බොරකරන්නේ මම කොහොමද වතුර බොන්නේ ?"

"අනේ වෘකරාල මා ඉන්නේ දොළේ පහළයි. නුඹ ඉන්නේ මට ඉහළිනුයි. ඉතින් කොහොමද වතුර බොරවෙන්නේ'

"හොඳයි උඹ මොකද පසුගිය සරත් සෘතුවේදී මගේ පියාට බැන්නේ වෘකයා ඇසුවා.

" නමුත් මා පසුගිය සරත් සෘතුවේදී ඉපදිලාවත් සිටියේ නෑ" බැටළු පැටියා කීවා.

වෘකයාට කේන්ති ගියා. ඌ මෙසේ කිවුවා.

"මේ බලපන්, නුඹට හැමදේකටම කියන්නට දෙයක් තියෙනවා. නමුත් මට බඩගිනියි. ඒ නිසා මම නුඹව දැන් කා දමනවා"



හොඳම බෙහෙත සහ නරක උපදේශය.

සිංහ රජතුමා මහලු වී ගුහාවට වී වැතිරී සිටියා. හැම සතෙක්ම පැමිණ තම ගෞරවය සිංහ රජතුමාට පුදකලා. නමුත් නරිරාල පැමිණියේ නෑ. නරිරාල සහ සිංහ රජුව භේද කරන්නට මෙය හොඳ අවස්ථාවක් බව දුටු වෘකයා නරියාගේ නුගුණ සිංහයාට කිව්වා.

"නරියා ඔබවහන්සේට කැමති නැහැ. ඌ එකපාරක්වත් ඔබතුමාව බලන්න පැමිණියේ නෑ."

ඒ වෙලාවේ ඒ අසලින් ගමන් කරමින් සිටි නරියා මඳක් කල්පනා කොට ගුහාව තුලට පැමිණ මෙසේ කිව්වා.

" අනේ මහරජ මාව මරන්නට කලින් කියන දේට පොඩ්ඩක් ඇහුම්කන් දෙන්න. මට ඔබතුමා බලන්න එන්ට බැරිවුණා තමයි. ඒ මට වෙලාවක් තිබ්බේ නැති නිසයි. මට වෙලාවක් හම්බවුණේ නැත්තේ මම ඔබතුමාට හොඳ වෙදෙක් සෙව්ව නිසයි. අන්තිමේදී මට හොඳ වෙදෙක් හොඳ බෙහෙතක් කිව්වා. මම ආවේ ඒක කියන්නයි."

"හොඳයි කියමු බලන්න බලන්න ඔය වටිනා බෙහෙත."

"ඔබ පණපිටින් ඉන්න වෘකයෙක් හමගසා උගේ හමේ උණුසුම යන්නට කලින් හම පොරවාගත යුතුයි." නරියා කීවා.

වහා වෘකයා මතට පැනගත් සිංහයා ඌව මරා දමා හම ගත්තා. නරියා සිනාසී මෙසේ කිව්වා. පාලකයන්ව නිතරම පෙළඹිය යුත්තේ හොඳ දේ කිරීමටයි. නරක දේ කිරීමට නොවෙයි.

බදාගැනීම සහ බෙදාගැනීම.

සිංහයා, නරියා සහ බූරුවා දඩයමේ ගියා.
112 විශාල සතුන් ප්‍රමාණයක් දඩයම් කරගත් මොවුන්
ආහාර බෙදාගන්නට සරසුණා. සිංහයා බූරුවාට ආහාර
බෙදන්නට කිව්වා. බූරුවා ආහාර සම සමව කොටස්
තුනකට බෙදුවා. සිංහයාට තරහ ගොස් බූරුවාව මරා
දැමුවා. ඉන්පසුව නරියාට ආහාර බෙදන්නට යැයි
කිව්වා. නරියා ආහාර විශාල ප්‍රමාණයක් සිංහයාට බෙදා
කුඩා ප්‍රමාණයක් ඌට ඉතිරිකර ගත්තා. සිංහයා සතුටට
පත්වුනා.

"හොඳයි, කවුද නුඹට මෙතරම් හොඳින් ආහාර බෙදන්නට ඉගැන්නුවේ?"

මේ දැන් ඔබ මරාදැමූ බූරුවාගෙන් තමයි මේ පාඩම මම ඉගෙන ගත්තේ."

කවුද බලවත්?

ඔලිව් ගහක් සහ උණ ගහක් අතර සංවාදයක් ඇති වුනා. ඔවුන් අතරින් බලවත් කවුද කියා. උණගස සුළඟත් සමඟ ඒ මේ අත වැනෙන නිසා ඔලිව් ගස ඊට හිනා වුනා. උණ ගස මුකුත් කීවේ නෑ. පුංචි සුළඟ කුණාටුවක් දක්වා වර්ධනය වුනා. සුළඟේ සැරට උණ ගස බිමටම පාත් වුනා. කුණාටුව ඉවර වූ පසු නැවත කෙලින් සිටවුණා. එහෙත් සුළං සැරට ඔලිව් ගසේ අතු රිකිලි සියල්ලම ඉදිරී වැටුණා. ඉතින් කවුද බලවත් ?

VI

බැටළු ආදරය.

එකෝමත් එක කාලෙක මිනිසෙකුට පූසෙකු සහ බැටළුවෙකු සිටියා. මිනිසා වැඩ ඇරී ගෙදර එනවිට පූසා දුවගෙන ගොස් මිනිසාගේ ඇඟට පැන ඔහුගේ මුහුණ ලෙවකා ආදරය පෙන්වනවා. ඉන්පසුව මිනිසා ඌට පාන් කැබැල්ලක් දෙනවා.

මේක දැකලා බැටළුවාටත් ඕනෑ වුනා ස්වාමියාට උගේ ආදරය පෙන්වන්න. ඉතින් දවසක් ඌ මිනිසා වැඩ නිම කර ගෙතර එනවිට දුවගෙන ගිහිල්ලා ඇඟට පැන්නා. ඉස්සරහා කකුල් දෙක මිනිසාගේ පපුවට තියලා මූණ ලෙවකෑවා. බැටළුවාගේ බර දරාගත නොහැකිව මිනිසා බිම ඇදගෙන වැටුණා. මිනිසා වැටෙනු දුටු ඔහුගේ පුතා සිතුවේ බැටළුවා තම පියාට පහර දුන්නා කියලයි. ඉතින් ඔහු කසයක් ගෙනැවිත් බැටළුවාට හොඳටම තැලුවා.

වැඩි ප්‍රවේසමත් හොඳ නෑ.

116

හාවෙක් බල්ලන්ගෙන් බේරීමට කැළය ඇතුලට දිව්වා. බල්ලන් කැළය ඇතුලට ආවේ නෑ. නමුත් හාවා කැළය ඇතුලටම දිව්වා. එහිදී වෘකයෙක් විසින් ඌව අල්ලා ගත්තා. " තමාට ලැබුණු දෙයින් සතුටුවන්න. මට හැංගෙන්නට හොඳ තැන් තිබියදීත් මා කැළය ඇතුලට ආවා. එය මගේ අවසානය වුණා. " හාවා කිව්වා.

ඔට්ටු තියලා අපි දුවමුද?

හාවා සහ ඉබ්බා වාද කලා තමන් අතරින් කවුද වේගවත් කියලා. ඔවුන් හැතැප්මක් දුවන්නට තීරණය කලා. තරඟය ආරම්භ වුණා. හාවා වේගයෙන් දිව්වා. ඌ දුවලා ගිහින් පස්ස හැරිලා බැලුවා. ඉබ්බා පෙනෙන තෙක් මානයකවත් සිටියේ නෑ. හාවා ගහක් යට නතර වී ගිමන් හැරියා. ටික වේලාවකින් සුව නින්දකට වැටුණා. නින්දෙන් අවදි වී ඇස් අරින විට ඉබ්බා හිමින් හිමින් ගොස් දිනුම් කණුව පසුකර සිටියා.

වටුවා සහ ගොවියා.

එක් කිරිල්ලියෙක් තම පැටවුන් සමඟ කුඹුරක පුංචි කූඩුවක් හදාගෙන ජීවත් වුණා. එය අස්වැන්න නෙළන කාලය බැවින් වටපිටාවේ සිදුවෙන දේ ගැන හොඳ සෙවිල්ලෙන් ඉන්නට යැයි පැටවුන්ට පවසා වටු මව කෑම සොයා ඉගිලී ගියා.

කෑම ගෙනැවිත් පැටවුන්ගෙන් ඇසුවා දවසේ වෙච්ච දේවල් ගැන,

"අද ගොවියා පැමිණ අම්මාට මෙසේ පැවසුවා, ගොයම නම් හොඳට පැහිලා තියෙන්නේ අපි අපේ යාළුවන්ට හා අසල්වාසීන්ට කියමු හෙට ඇවිත් අස්වැන්න නෙලන්නට අපට උදව් වෙන්නටයි කියා" පැටව් කිව්වා.

"බයවෙන්න එපා දරුවනේ තවම අපට මෙහෙන් යන්නට කාලය ඇවිත් නෑ" වටු මව කිව්වා.

පසුදිනත් වටු මව ගොස් පැටවුන්ට කෑම ගෙනැත් දී දවසේ වුණු දේවල් පිළිබඳව ඇසුවා.

"අද ගොවියා පැමිණ යහළුවන් හා අසල්වැසියෝ එනතුරු බලා සිටියා නමුත් කවුරුවත් ආවේ නෑ. ඔහු පුතාට කිව්වා. නෑදෑයින්ට එන්න කියන්න කියලා ගොයම් කපන්නට. අපිට දැන්නම් යන්න වෙයි නේද අම්මේ? පැටව් බියෙන් ඇසුවා.

"බයවෙන්න එපා දරුවනේ හෙටත් ගොයම් කපන්නේ නෑ" වටු මව කීවා.

තෙවැනි දිනයේත් වටුවා කෑම සොයා පැමිණ දරුවන්ගෙන් මොකද වුණේයැයි ඇසුවා.

"අදත් ගොවියා සහ පුතා පැමිණ හුඟ වේලාවක් බලා සිටියා. බලන් ඉඳලා ගොවියා පුතාට කිව්වා, අපිට කාගෙන්වත් උදව් ඕනේ නෑ. ආයුධ ටික ලෑස්ති කරගන්න හෙට ඇවිල්ලා අපි ගොයම් කපමු."

දැන්නම් අපිට යන්නට කාලය හරි. කව්රු වෙනුවෙන්වත් බලන් ඉන්නැතිව ගොයම් කපනවානම් හෙට ගොවියා ගොයම් කපාවි. අපි දැන් යන්න ලෑස්ති වෙමු." වටු මව කීවා.

කුරුළු රජකම.

කුරුල්ලෝ තීරණය කලා තමන්ට කුරුළු රජෙක් අවශ්‍යයි කියා. මෙවේලේ ඔවුන් පිහාටු පුම්බා ගෙන සිටින මොණරාව දැක ඌව රජා හැටියට තෝරාගත්තා.

එක් පොල්කිච්චෙක් අළුත් රජුගෙන් මෙසේ ඇසුවා.'' අපිට කියන්න උකුස්සා අපට පහර දෙද්දී ඔබ කොහොමද අපිව ඌගෙන් බේරගන්නේ කියා?''

මොණරා කිසිවක් කියාගත නොහැකි තත්වයට පත්වුණා. අනෙක් කුරුල්ලන්ද මේ ගැන වාද කරන්නට වුණා. අන්තිමේදී ඔවුන් කුරුළු රජු හැටියට රාජාලියෙකු තෝරාගත්තා.



වලසා සහ මී මැස්සෝ

දවසක් වලසෙක් කැලෑව තුලින් ගාට ගාට ආවේ ය. එසේ එද්දි හදිසියේ මී මැසි කූඩුවක් දුටුවේ ය.

එහි තිබුණු පැණි පිරුණු මී වද සොරකම් කිරීම ගැන කේන්ති වූ මී මැස්සෝ උෟට විදින්නට වුහ. අනේ, අනේ මගේ නාසය කියා කෑ ගසමින් කැලෑව දෙසට ගියේ ය.

කදිම විනිශ්චය.

සරත් කාලයේදී මී මැස්සන් හා මී මැස්සියන් අතර වාදයක් ඇති වුණා. ඔවුන් වාද කලේ රැස්කරත් මී පැණි කන්නේ කවුද කියලයි. ඔවුන් මෙයට විනිශ්චයක් ලබාදෙන ලෙස බඹරාට කිව්වා. එවිට බඹරා මෙසේ කිවුවා.

"මට එකපාරටම තීරණය කරන්නට බෑ. අනික මී පැණි හදන්නේ කවුද කියලාවත් මම දන්නේ නෑ. නමුත් මම උපදෙසක් දෙන්නම්. මී මැස්සන් එක වදයකට යන්න. මී මැස්සියන් අනෙක් වද්දයකට යන්න. මම සතියකින් ඇවිත් බලන්නම් කවුද මී පැණි රසවත්ව හදන්නේ කියා.

මී මැස්සන් එය ප්‍රතික්ෂේප කලා.

'බොහොම හොඳයි. මම කියන්නම්' බඹරා කිව්වා.

"ඔබලා මෙයට එකඟ නැත්තේ ඔබලා මී පැණි හදන්න දන්නේ නැති නිසයි. අනුන්ගේ මී පැණි කන්න ඕන නිසයි."

මී මැස්සියනේ මොවුන්ව වහාම එලවා දමන්න. එය ඇසූ මී මැස්සියන් මී මැස්සන්ට එලවා එලවා පහර දුන්නා.

124

කවුද වැදගත්.

මොණරෙක් සහ කොකෙක් තමන් අතරින් කවුද වැදගත් යන්න පිළිබඳව තර්ක කලා. මොණරා මෙසේ කිවුවා.

''මම තමයි කුරුල්ලන් අතරින් ලස්සනම කුරුල්ලා, මගේ වලිගය හරියට දේදුන්නක් වගේ දිලිසෙනවා. නමුත් උඹ නිකම්ම කොකෙක්, අළු පාටයි සුදු පාටයි විතරයි උඹට තියෙන්නේ ''

'' නමුත් නුඹ පහළ මඩ වගුරු වල ඇවිදිද්දී මම පියාසර කරන්නේ ඉහල අහසෙයි'' කොකා පිළිතුරු දුන්නා.

වටුවා සහ දඩයක්කාරයා

දිනක් දඩයක්කරුවකුගේ දැලට එක් වටුවෙක් පමණක් අසුවුණා.

"අනේ මට යන්න දෙන්න, මම ඔබට සේවය කරන්නම්.මම තව විශාල වටුවන් ප්‍රමාණයක් ඔබේ දැලට අසුකර දෙන්නම්."

වටුවා බැගෑපත් වුණා.

"මම නුඹට යන්නට දෙන්නේ නැහැ. නමුත් දැන් නුඹ කී කතාව නිසා කොහොමටත් යන්න දෙන්නේ නැහැ. නුඹේ නෑදෑ හිතමිතුරන් පාවා දීමට තෑග්ගක් වශයෙන් මා නුඹේ බෙල්ල මිරිකා දමනවා. දඩයක්කරු වටුවාට 125
කිව්වා.

ගේ කුරුල්ලා

දවසක් මිනිසෙක් හණ බීජ වැපිරීමට යනවා ගේ
126 කුරුල්ලෙක් දුටුවේය. ගේ කුරුල්ලා ඉගිළ ගොස් අනිත්
කුරුල්ලන්ට මේ ගැන කීවේ ය.

"ගිහින් අර හන මුට්ටියේ බීජ ටික හැකි ඉක්මනින් ගොස් උදුරා ගන්න. හණ බූටිය වැවුනහම, හන ලණු හදයි, ඉන් පසුව ඒ වායෙන් දැල් හදයි, අපව අල්ලන්න."

කුරුල්ලෝ ගේකුරුල්ලාගේ දැනුම් දීම ගැන සැලකිල්ල නොදැක්වූහ ඔවුන් හණ බීජ උදුරාගත්තේ වත් නැත. හණ බූටියේ මල් පිපුණි, නැවතත් ගේකුරුල්ලා කුරුල්ලන්ට හණ බූටිය ගැන මතක් කළේ, එයින් අනාගතයේ හේතුවිය හැකි අණතුරු නොමැති බව කීහ. හණ බූටිය වඩාත් හොඳින් වැඩී මෝරන්නට විය. තුන්වන වතාවටත් ගේ කුරුල්ලා කුරුල්ලන්ට මතක් කළේය. ඔවුන් ඒ ගැන සැලකිලිමත් වී මිනිසුන්ගේන් ඈත්ව ජීවත් විමට ඉගිල ගියහ.

රාජාලියා සහ පරෙවියෝ.

රාජාලියා පරෙවියන්ව අල්ලගන්නට උන් පසුපස එලෙව්වා. නමුත් එක් පරෙවියක්ව අල්ලගන්නට බැරිවුනා. ඒ නිසා රාජලියා උපායක් කල්පනා කළා. ඌ පරෙවි කූඩුවට පියාඹා ගොස් තමාව පරෙවියන්ගේ රජා හැටියට පිළිගත්තොත් කිසිම සතෙකුගෙන් හිංසාවක් නොවන්නට වග බලාගන්නා බව පැවසුවා.

පරෙවියන් මෙයට එකඟ වී රාජාලියාට කූඩුවේ ඉන්නට ඉඩ දුන්නා. කූඩුවේ නැවතුනු පසු රාජාලියාගේ අහිංසක ස්වරූපය නැතිවී නියම ස්වරූපයට පැමිණියා. ඌ මෙසේ කිව්වා,

"මම ඔබලාගේ රජු නිසා ඔබලා මට අවනත විය යුතුයි. ඔක්කොමටම කලින් නුඹලා මට රෑ කෑමට එක් පරෙවියෙකු බැගින් දිය යුතුයි."

හැම දිනකම රාජාලියා එක් පරෙවියෙකු බැගින් මරා කෑවා. පරෙවියන් බලාපොරොත්තු සුන් තත්වයට පැමිණ මෙයට කලයුතු ක්‍රියාමාර්ගයක් සෙව්වා.

"රාජාලියාට කූඩුවේ ඉන්නට ඉඩ නොදෙන්නටයි අපට තිබුනේ." පරෙවියන් කථා වුනා.

"අපිට දැන්නම් කළහැකි කිසිදෙයක් නෑ" ඉතිරි පරෙවියන් කණගාටුවෙන් කිව්වා.

මිනිස්සු සහ නොමිනිස්සු.

එක්තරා මඟුල් ගෙදරකට විශාල මිනිසුන් ප්‍රමාණයක් පැමිණ සිටියා. අසල් වැසි මිනිසෙක් තම මෙහෙකරුට මඟුල් සාදය තිබුනු නිවසේ සෙනඟ කොච්චරක් ඉන්නවද කියා බලන්නට කියුවා. මෙහෙකරු ගොස් නිවසේ දොර ලඟින් ලොකු ලී කොටයක් තබා පැත්තකටවී බලා සිටියා. සාදය අවසන් වී නිවසින් පිටවන මිනිසුන් මේ කොටයේ හැපී වැටුනා. ඔවුන් එයට ශාප කරමින් යන්නට ගියා. එහෙත් එක මැහැල්ලක් පමණක් මේ කොටය අයින් කර එතනින් යන්නට වුනා.

128 සියල්ලෝම පිටවී ගිය පසු මෙහෙකරු ගෙදර ගියා.

"කීදෙනෙක් ඇවිත් සිටියාද?" ස්වාමියා ඇසුවා.

" එක්කෙනයි. මහළු ගැහැණියක් පමණයි." මෙහෙකරු උත්තර දුන්නා.

"ඒක වෙන්නෙ කොහොමද?"

තමා දොර ලඟින් ලී කොටය තැබූ සැටිත්, මිනිස්සු එහි හැපී වැටුන සැටිත් එක් ගැහැණියක් පමණක් ලී කොටය අයින් කල බවත් ඔහු ස්වාමියාට කිව්වා.

130

දෙකම එකයි.

මැටි කළයක් පිත්තල කළයක් වාද කලා මැටි කළයට කේන්ති ගොස් පිත්තල කළයට ගහන්නට පැන්නා.

"ඔබ මට ගැහුවාට හෝ මම ඔබට ගැහුවා කියලා කිසිම වෙනසක් වෙන්නේ නෑ."

පිත්තල කළය කිව්වා.

"වෙන්නේ ඔබව කෑලි වලට කැඩෙන එක විතරයි."

වවුලා සහ පිල් මාරුව.

එකෝමත් එක කාලෙක දී කුරුල්ලෝ සහ සිව්පාවෝ අතර දරුණු යුද්ධයක් පැවතුණා. නමුත් වවුලා මේ දෙගොල්ලන්ගෙන් එක් පැත්තකටවත් එකතු වුනේ නෑ. ඌ පැත්තකට වී බලා සිටියා. දිනන පැත්තට එකතු වීමේ අදහසින්. කුරුල්ලන් ජයගන්නවා වගේ පෙනෙන විට වවුලා ඔවුන්ට සම්බන්ධ වුනා. කුරුල්ලන් එක්ක පියෑඹුවා. නමුත් හදිසියේම සිව්පාවන් ජයගන්නට යන බව පෙනෙන විට ඌ උගේ පාද හා දත් සිව්පාවුන්ට පෙන්වා ඒ පැත්තට ගියා. එහෙත් අන්තිමේදී ජයගත්තේ කුරුල්ලන්ය. වවුලා කුරුල්ලන්ගේ පැත්තට යන්නට 131
සූදානම් වුවත් කුරුල්ලන් ඌව පන්නා දැමුවා.

මේ නිසා වවුලාට නැවත සිව්පාවුන් ළඟට යෑමටත් බැරිවුනා. වවුලා දිවා කාලයේ බෙණවල හා අඳුරු ගුහාවල ජීවත් වෙන්නේත් රෑ බෝ වූ පසුව බෙණවලින් එලියට එන්නේත් ඒ නිසායි.

මසුරාගේ වස්තුව.

එක්තරා මසුරෙක් හම්බකරන සියලුම දේ පොට්ටනියකට දමා වත්තේ වැළලුවා. හැමදාම රෑට ඇවිත් ඒවා එතන තිබේදැයි සොයා බැලුවා.

ඔහුගේ මෙහෙකරු මේ බව දැනගෙන වල හාරා වස්තුව ලබාගෙන පලා ගියා. එදා රෑ එහි පැමිණි මසුරා දුටුවා තමාගේ වස්තුව කවුරුන් හෝ සොරාගෙන ඇති බව. ඔහු මහත් සේ දුකට පත් වී මහ හයියෙන් ඇඬුවා. මෙය ඇසුණු අසල්වැසියෙක් පැමිණ මෙසේ කිව්වා.

132 " ඇයි ඔබ අඬන්නේ, ඔබ එම මුදල් වලින් කිසිම වැඩක් ගත්තේ නැහැනේ ඉතින් එය තිබුණා හෝ නැතිවුණා හෝ කියා ඔබට දුක්වෙන්නට ඕන කමක් නෑ."

දුදනන්ට කළ උපකාරය.

ළිඳකට වැටී සිටි බල්ලෙක් බේරාගැනීම එක් මිනිසෙක් ඔහුගේ අත බල්ලා වෙතට දික්කලා. නමුත් බල්ලා අත හපා කෑවා. මිනිස් ඌව අතහැර මෙසේ කිව්වා."නුඹ ලිඳට වෙලා හිටපන් නුඹව බේරා ගැනීමට තැත් කළ මට මෙහෙමද සළකන්නේ ."

තෑග්ගක් වු දඩුවම.

බල්ලෙක් කුකුළන් පසුපස එලෙව්වා. මේ කරදරයෙන් මිදෙන්නට ඌගේ හාම්පුතා බල්ලාගේ බෙල්ල වටේ දණ්ඩක් ගැටගැහුවා. එයින් සිදු වු ලැජ්ජාව වසා ගැනීමට ඌ මෙහෙම කිව්වා.''බලන්න මගේ ස්වාමියා මට කොච්චර ආදරෙද කියා. එහු මාව අනිත් බල්ලන්ගෙන් වෙන්කර තබන්නට මෙය මට තෑගි කළා.''

136

එඬේරාගේ පොරොන්දුව සහ දෙවියන් වහන්සේ.

බැටළුවෙක් නැති කරගත් එඬේරෙක් දෙවිටන්ට කන්නලව් කරමින් බැටළුවා සොරාගත් සොරුන් සොයා දුනහොත් කොපෙක් දහසක ඉටිපන්දම් පත්තුකරන බවට පොරොන්දු වුණා.

පසු දින කැළයට යද්දී ඔහු දුටුවා වෘකයන් විසින් බැටළුවා කන ආකාරය. දෙවියන් විසින් ඔහුට හොරුන්ව පෙන්වා දෙනු ලැබුවා. එහෙත් වෘකයන් පැමිණ ඔහුවත් අල්ලාගනු ලැබුවා. විට ඔහු දෙවියන්ට කන්නලව් කරමින් තමන්ව වෘකයන්ගෙන් බේරාගනු ලැබුවහොත් රෑබලයක් ඉටිපන්දම් පත්තු කරන බව පැවසුවා.

බල්ලා පිදුරු කන්නෙත් නෑ
කන ගොනාට දෙන්නෙත් නෑ.

බල්ලෙක් පිදුරු ගොඩක් මත වැතිර් සිටියා. බඩගිනි වී සිටි ගොනෙක් පිදුරු කෑමට සිතා එතැනට පැමැණියා. පිදුරු ටිකක් ගන්නවාත් සමඟම වැතිර් සිටි බල්ලා අවදිවී ගොනාට බුරන්නටත් හපාකන්නටත් පටන් ගත්තා. ගොනා මෙසේ කියමින් යන්නට යන්නට ගියා

"බල්ලා පිදුරු කන්නෙත් නෑ කන ගොනාට දෙන්නෙත් නෑ"

වෘකයා සහ මස් කටුව.

මස් කටුවක් රැගෙන යමින් සිටි වෘකයෙක්ට පුංචි බලුපැටව් දෙදෙනෙක් බුරාගෙන පැන්නා. උන්ව කෑලි වලට කැඩීමට වෘකයාට හැකියාව තිබුණත් මස් කටුව ගිලිහේ යැයි බියෙන් ඌ එතැනින් වහා පලා ගියා.

140

බල්ලා සහ හොරා.

එක්තරා හොරෙක් නිවසකට ඇතුල්වුනා සොරකම් කිරීමට. නිවසේ සිටි බල්ලා හොරාව දැක බිරුවා. සොරා තමන් ලඟ තිබූ පාන් කැබැල්ලක් බල්ලාට දුන්නා. එහෙත් බල්ලා එය ප්‍රතික්ෂප කර සොරාගේ කකුල හපාකෑවා.

"ඇයි ඔබ මාව හැපුවේ, මම ඔබට පාන් කරබැල්ලකුත් දුන්නනේ" සොරා කිව්වා.

"මම කියන්නම් ඇයි කියලා, ඔබ මට පාන් කෑල්ල දෙන්න කලින් මම දැනගෙන හිටියේ නෑ ඔබ හොඳ පුද්ගලයෙක්ද නරක පුද්ගලයෙක්ද කියා. නමුත් මට පාන් කෑල්ලක් අල්ලස් වශයෙන් දීමෙන් පෙනී යන්නේ ඔබ නරක ඉතා පහත් පුද්ගලයෙකු බවයි" බල්ලා කිව්වා.

142

අශ්වයාගේ කොරය හා වෘකයාගේ බෙහෙත්.

වෘකයෙක් අශ්ව ගාලක් දෙස බලාසිට ඔවුන් ළඟට ගොස් මෙසේ පැවසුවා " ඇයි මේ වෙළඹ කොර ගසන්නේ ? වෘකයෝ වන අපි දන්නවා කොරගැසීම සුවකිරීමට බෙහෙත්"

" අනේ වෘකයෝ මගේ පිටිපස්සේ කකුලේ ලොකු වේදනාවක් තියෙනවා. ඔබට පුළුවන්ද එය සුව කිරීමට." වෙළඹ ඇසුවා.

"අපොයි පුළුවනි." වෘකයා කිව්වා

වෘකයා වෙළඹගේ පිටුපසට ගොස් ළඟට ළංවූ සැණින් අශ්වයා වෘකයාගේ දත් කැඩියන සේ පහරක් එල්ල කළා.



නරියා සහ වෘකයා

දවසක් වෘකයෙක් උගේ දත් මුවහත් කරමින් සිටින ආකාරය නරියා දුටුවේ ය.

''ඇයි ඔයා දත් මුවහත් කරන්නේ? ඔයාට සටනට කිසිම කෙනෙක් ඇත්තේ නැහැනේ''

''බොහොම කාලෙකින් කිසිම කෙනෙක් එක්ක සටනට ගියේ නැහැ, මේ දත් මුවහත් කරන්නේ ඒකයි''

''සටනක් පටන් ගනිද්දි දත් මුවහත් කරන්න වෙලාවක් නැහැ''

ගෝනා සහ අශ්වයා

දවසක් ගෝනෙක් අශ්වයෙකුට ඌගේ අංතට්ටුවෙන් ඇන ලේ ගලන තෙක් තුවාල කර වනයෙන් පන්නා දැමුවේය. එවිට අශ්වයා මනුෂ්‍යයෙක්ව සොයාගෙන ගොස්, ගෝනාගෙන් ඔහුව ආරක්‍ෂා කරදෙන මෙන් ඉල්ලා සිටියේ ය. 145

අශ්වයාට උදව්වට පැමිණි මිනිසා ගෝනාව පලවාහැරීමට අශ්වයාට සැදැලයක් සහ කට කලියාවක් දැමුවේ ය. අශ්වයාගේ පිටේ ගොස් ගෝනාව පලවා හැරියේ ය. ඉන් පසු අශ්වයා තමන්ව නිදහස් කරන මෙන් ඉල්ලා සිටියේ ය.

''නැහැ නැහැ'' ඔබ මොන තරම් ප්‍රයෝජනවත් අයෙක්ද කියන්න මම දන්නවා '' යැයි කියා අශ්වයාට යන්නට නොදුන්නෝය.

මැඩියන් දෙදෙනා

පැවිල්ල නිසා පොකුණු සහ වගුරු සියල්ල සිඳී ගිය නිසා දිනක් මැඩියන් දෙදෙනෙකු වතුර සොයා ගෙන යද්දී ඔවුන් දෙදෙනා ලිදක බැම්ම උඩට පැන ඒ මත ඉඳගෙන වතුරට පනිනවාද ? නැද්ද ? කියලා හිතමින් සිටියා.

'' මේක ඇතුලේ වතුර ටිකක් තියෙනවා. මෙහෙ අපිට කරදර කරන්න කෙනෙකුත් නැහැ, ඒක හින්දා

''අපි මේකට පනිනන ඕනෙ'' කියලා තරුණ මැඩියා කිව්වා.

''දැන් මේක ඇතුලේ වතුර ටිකක් තිබුනට ඒ ටිකත් හිඳුනොත් අපිට කවදාවත් ගොඩට එන්න වෙන්නෙ නැහැ. ඒක හින්දා පනින්න බැහැ'' කියලා අනිත් මැඩියා කිව්වා.

නවාතැන් දීම.

වෘක ධේනුවක් තම පැටවුන් සමඟ ඌරෙකුගෙන් නවාතැන් ඉල්ලුවා. මෙයට අකමැත්තක් නොදැක්වූ ඌරා වෘක ධේනුවට එහි ළඟින්නට ඉඩ දුන්නා. පසු දින ඌරා පැමිණ ඔවුන්ට යන්නටැයි පැවසුවා.

"මගේ පැටවුන් තවම පොඩියි ඒ නිසා මට තව කාලයක් ඉන්න දෙන්න" වෘක ධේනුව කිව්වා. ශරත් සෘතුවත් පසුවුණා. වෘක පැටවුනුත් දැන් ලොකුයි. ඌරා නැවත ගොස් තම කූඩුව ලබාදෙන ලෙස ඉල්ලා සිටියා. නමුත් වෘක ධේනුව ගොරවා මෙසේ කිව්වා.

"මට කරදර නොකර මෙතැනින් පලයන් අපේ මෙතැන හය දෙනෙක් ඉන්නවා. ඉතින් නුඹව කෑලි වලට කඩන්න පුළුවන්"



ගවයා සහ මැඩියා

එක්තරා දවසක මැඩියන් පිරුණු විලකට ගවයෙක් පැමිණියේය. එවිට තැනින් තැන දුව පනිමින් සිටි එක් මැඩියෙක් හැර අන් මැඩියන් විලට පැන්නේය. එක් කුඩා මැඩියෙක් ගෙදර ගොස් තම මවට පැවසුවා

''ඔහ් අම්මේ අද මම දැක්කා භයානක විශාල සතෙක්ව''

'' මොකක්ද මට වඩා විශාලයි ද?'' අම්මා ඇසුවා.

''තරමක් විශාලයි''

වයසක මැඩි අම්මා උගේ ඇග පුම්බලා ඇහුවා

''දැනුත් මට වඩා විශාල ද?''

''ඔව්..''

ඌ තව තවත් උගේ ඇග පිම්බුවාය.

''තවමත් ඌ මට වැඩි විශාලද?''

''ඔව් ජීවිතේටම ඔයාට බැහැ ගවයෙක් තරමට පිම්බෙන්න''

මහළු මැඩියා හැකි උපරිමයෙන් උගෙ ඇඟ පුම්බන්න ගොස් පිපුරුවේ ය.

රජෙක් ඉල්ලූ මැඩියෝ

එක්තරා විලක මැඩියන් රංඩු කරන්නට පටන් ගත් විට, එතැන කවුරුත් හිටියේ නැහැ කවුද හරි කවුද වැරදි කියලා තීරණය කරන්න. ඒ නිසා ඔවුන් දෙවියන්ගෙන් ඉල්ලුවා ඔවුන්ට රජෙක් ලබා දෙන්න කියලා. එවිට විලට ඉහලින් තිබූ ගසක අත්තක් කැඩිලා වතුරට වැටුනා.

"මෙන්න අපට රජෙක්" යයි කියූ මැඩියෝ ඈතට ගියේ ය. අත්ත මඩේ එරිලා තිබුණා.

මැඩියෝ කිසිම බයක් සැකක් නැතුව අත්ත ළඟට පිනන්නටත් එහි නගින්නටත් පටන් ගත්තා. අත්ත සෙලවුණේ වත් නැත.

මැඩියන්ට තේරුනා ඔවුන්ගේ රජතුමා නිහඬ වගේම ඔවුන්ගේ ප්‍රශ්න වලට විසඳුමක් නොදෙන බව, ඒ නිසා ඔවුන් වෙනත් රජ කෙනෙක් ඉල්ලන්නට වූවේ ය.

ඒ වෙලාවේ කොකෙක් විලට ආවේ ය.

"මෙන්න නියම රජකෙනෙක් විලට ආවා" යැයි මැඩියෝ සතුටින් කෑ ගැසුවාය.

එහෙත් කොකා විලේ සිටි මැඩියන් එකා බැගින් අල්ලාගෙන කන විට මැඩියන්ට හිතුනා ඔවුන්ගේ නිහඬ, පරණ රජු හොඳයි කියලා.

අපූරු දිව්රුම.

මිනිසුන් දෙදෙනෙක් රෙදි කඩයකට ගොස්
150 මුදලාලිගෙන් සළු ඉල්ලා සිටියා. ඔවුන් සළු මිලදීගත්තේ
නැතත් ඔවුන් යන්නට සැරසෙද්දී එක් සළුවක් අඩු බව
මුදලාලි වටහා ගත්තා. මුදලාලි ඔවුන් දෙදෙනාම නවත්වා
ගත්තා.

" මා ඔබේ සළුව ගත්තේ නෑ," එකෙක් දිව්රුවා. " මා ළඟ ඔබේ සළුවක් නෑ " අනෙකා දිව්රුවා. " එසේනම් ඔබ දෙදෙනාම හොරු." මුදලාලි කිව්වා. එසේ පවසා සළුව ගත්තේ නෑ කියූ පුද්ගලයාව සෝදිසි කලා. ඔහු ළඟ තිබී සළුව හම්බුණා. පසුව ඔවුන් දෙදෙනාම නඩුකාරයා ළඟට කැඳවාගෙන ගියා.

සූසීයා සහ සුළඟ

එක දවසක් කවුරු බලවත්ද කියා සෙවීම සඳහා සූසීයා සහ සුළඟ අතරේ විවාදයක් විය. පුද්ගලයෙක් දැඩිව ඇඳුම් ඇගේ දමාගෙන යද්දී එය ඉවත්කර සාමාන්‍ය ආකාරයෙන් යැවීමේ බලය ඇත්තේ කාටද යන්න තීර්ණය කිරීමයි. මුලින්ම සුළඟ තම ශක්තිය යොදා හමද්දී මිනිසාගේ උඩුකය ඇඳුමේ බොත්තම් තදකර ගත්තේය. ඒත් සුළඟට ඇඳුම ඉවත් කිරීම කළ නොහැකි විය. ඊ ළඟට වූයේ සූසීයාගේ වාරයයි. ඉතා ඉක්මණින් උණුසුම් වන්නට විය. එවිට මිනිසා ඔහුගේ උඩුකබායේ බොත්තම් ගලවා හිස් වැසුම ඉවතට විසි කළේය. ඉන් පසුව තව තවත් උණුසුම් වෙද්දී ඔහු ඇඳුම් සියල්ල ඉවත් කරන්නට වූවේය.



ලියෝ තෝල්ස්තෝයි

කුහුඹියා සහ පරවියා

Cover Designing by Champika Prasad @ Isira Creations - 071 8 416 436

මිල: රු. 500/=

ISBN978-955-8499-87-0

කඩුල්ල ප්‍රකාශන
KADULLA PUBLICATION
240/3, පහළ බියන්විල, කඩවත.
දුර : 071 8 179 230 / 011 2 901 492
ෆැක්ස් : 071 9 376 914
email : kadullabooks@gmail.com